2018 නොවැම්බර් මස 23වැනි සිකුරාදා

# පාර්ලිමේන්තු විවාද

නොවැ.
23

## ජවිපෙ නායක
## අනුර දිසානායක සහෝදරයාගේ
## විශේෂ පාර්ලිමේන්තු කතාව

## වචනයක්

යුද්ධයකදී පළමුව වෙඩි වදින්නේ සත්‍යයට යැයි කියමනක් තිබේ. 2018 ඔක්තෝබර් 26 දින ලංකාවේ දිගහැරුණු දේශපාලන කුමන්ත්‍රණයෙන් පසු ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය හැසිරීම නිරීක්ෂණය කරන විටද පෙනෙන්නේ ඊට නොදෙවෙනි ස්වභාවයකි. මෙම තත්වය හමුවේ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් නොවැම්බර් 23වැනි දින පැයක කාලයක් පුරා පවත්වන ලද පාර්ලිමේන්තු කතාව වත්මන් දේශපාලන අර්බුදයේ විවිධ පැතිකඩයන් පිළිබඳ අපූර්ව විවරණයක් සැපයීය.
මෙම කතාවේ ලිඛිත සටහනක් ලබා දෙන ලෙසට අප වෙතින් කරන ලද බලවත් ඉල්ලීමට පිළිතුරක් ලෙස එදින හැන්සාඩ් වාර්තාව පදනම් කරගනිමින් මෙම පොත් පිංච ඔබ අතට පත් කෙරේ.

**නියමුවා ප්‍රකාශන**
**2018.11.27**

**ගරු කථානායකතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව මම ස්ථිර කරමින් ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමතියි.**

ගරු කථානායකතුමනි, අද අපේ රටේ විශාල අරාජික තත්වයක් මතු වී තිබෙනවා. ඔබතුමා විසින් පසුගිය 15වැනිදා මෙම පාර්ලිමේන්තුවේ ප්‍රකාශයට පත්කර තිබෙනවා, ආණ්ඩුවක් නොමැති බව. එමනිසා අද අපේ රටේ ආර්ථිකයේ ඉතාමත් වැදගත් මර්මස්ථානවලට මේ ඇති වී තිබෙන තත්වය විශාල බලපෑමක් ඇතිකොට තිබෙනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයට විශාල බලපෑමක් ඇතිකොට තිබෙනවා. මුළු රාජ්‍ය යන්ත්‍රණයම විශාල කඩා වැටීමකට ලක් වී තිබෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුවත්, පොදු ජනතාවත් මේ ඇති වී තිබෙන අස්ථාවරභාවය පිළිබඳව අවධානය යොමු කරමින්, මෙම අස්ථාවරභාවය අවසන්කොට රට යථා තත්වයට පත් කිරීම සඳහා අපි හැමදෙනාටම වගකීමක් තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා. මෙම අස්ථාවරභාවය ඕපපාතිකව නිර්මාණය වූවක් කියා අපි පිළිගන්නේ නැහැ. එක්කෝ මහා දැවැන්ත සුනාමියක් එසේ නැත්නම් දැවැන්ත ගංවතුරක් වැනි තත්වයක් විසින් නිර්මාණය ලද්දක් නොවෙයි, මේ අද අපේ රටේ ඇති වී තිබෙන අස්ථාවරභාවය, මේ අරාජිකත්වය දේශපාලන කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්. එම නිසා

පසුගිය ඔක්තෝබර් මාසයේ 26 වැනිදා ඉතාමත් පැහැදිලි ලෙස අපේ රටේ දේශපාලන කුමන්ත්‍රණයක් සිද්ධ වුණා. ලංකා ඉතිහාසයේ ආණ්ඩු පෙරළුණු ඉතිහාසයන් අපි දැක තිබෙනවා. අග්‍රාමාත්‍යවරුන් මාරු වුණු ඉතිහාසයන් අපි දැක තිබෙනවා.

එක පැත්තකින් මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් මැතිවරණයට අවශ්‍ය වන කටයුතු සූදානම් කරලා, ඒ දේශපාලන පක්ෂ මැතිවරණයට තරඟ වැදිලා ඡන්ද දිනයේදී ජනතාව ඡන්දපොළට ගිහින් ඡන්දය දීලා ඡන්ද ප්‍රතිඵල අනුව පසුවදා ආණ්ඩුවක් පිහිටුවනවා. ඒ ආණ්ඩුව පිහිටුවීම මොනතරම් ප්‍රජාතන්ත්‍රවාදී ද, නැද්ද කියන එක කෙසේ වුවත්, ඒ ආණ්ඩු පිහිටුවීම මේ රටේ ජනතාව අනුමතකොට තිබෙනවා. ඒ වාගේම තවත් අවස්ථාවක් තිබෙනවා; එක මහ මැතිවරණයක සිට තව මහ මැතිවරණයක් දක්වා කාල පරිච්ඡේදයක් ඇතුළත තිබෙන ආණ්ඩුව පරදවා තව ආණ්ඩුවක් පිහිටුවා ගන්න අවශ්‍ය නම් ඒ සඳහා මේ පාර්ලිමේන්තුවට අවස්ථාවක් තිබෙනවා. බහුතර කැමැත්තෙන් ආණ්ඩුවක් පත් කර ගන්න. එය මිලදී ගැනීම්, පැනීම් හරහා සිදු වුවත් එයත් මේ රටේ සම්ප්‍රදායක් හැටියට අපි පිළිගත යුතුව තිබෙනවා. ඒ වාගේම දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි පිළිගන්නවා, මහ ජනයා පාරට බැහැලා උද්ඝෝෂණය කරලා ඉතාම දුර්දාන්ත පාලනයක් පළවා දැමූ අයුරු අපි ඉතිහාසයේ දැක තිබෙනවා. එවැනි පලවා හැරීමුත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි පිළිගන්නවා. ඒ නිසා අපේ රටේ ආණ්ඩු පෙරළීම් සඳහා පිළිගත යුතු ආකාර තුනක් තිබෙන බව අපි විශ්වාස කරනවා. එකක්, ඡන්දයක්. එක්කෝ ඡන්දයක් සහ තව ඡන්දයක් අතර පාර්ලිමේන්තුව හරහා, තව අවස්ථාවක් තමයි තිබෙන දුර්දාන්ත පාලනය පෙරළා දැමීමේ මහජන බලවේගයන් හරහා.

හැබැයි, පසුගිය 26 වැනිදා රාත්‍රියේ සිදුවූයේ මේ පිළිගත් කිසිදු සිද්ධාන්තයකට අදාළ වන ආණ්ඩු පෙරළියක් නොවෙයි. රටේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ මහින්ද රාජපක්ෂ

මහත්මා කැඳවා මේසයේ එක පසෙක මහින්ද රාජපක්ෂ මහත්මයා සිටගෙන, මෛත්‍රීපාල මහත්මයා තව පසෙක සිටගෙන මෛත්‍රීපාල මහත්මයා කියනවා, "නුඹ අගමැති - මම ජනපති" කියලා. එහෙම කියලා ආණ්ඩුවක් හදනවා. එවැනි කුමන්ත්‍රණකාරී ආණ්ඩු පෙරළීම් අපි පිළිගත යුතුද? ආණ්ඩුවක් පෙරළා දැමිය හැකිව තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම සියල්ල උල්ලංඝනය කරමින් තනි පුද්ගලයෙකුගේ, දෙදෙනෙකුගේ හිතුවක්කාරී, තක්කඩි වුවමනාවන් සඳහා ආණ්ඩු පෙරළීම දේශපාලන කුමන්ත්‍රණයක් ලෙස අපි තේරුම්ගත යුතුව තිබෙනවා.

අපි මේ රටේ පොදු ජනයාට ස්තුතිවන්ත වනවා. ලෝකයේ වෙනත් රටක මෙවැනි වර්ගයේ ආණ්ඩු පෙරළීම් සිද්ධ වුණා නම් ඒක ලේ ගංගාවකින් කෙළවර වෙන එක වළක්වන්න බැහැ. අපේ රටේ සිය මතය අනුව දේශාපාලන පක්ෂවලට බෙදිච්ච ජනතාවක් ඉන්න පුළුවන්; දේශපාලන පක්ෂ පිළිබඳව වෙනස් කෝණයෙන් බලන මාධ්‍යවේදීන් ඉන්න පුළුවන්. හැබැයි, අපි හැමදෙනාම පොදු එකඟතාවකට ආ යුතුව තිබෙනවා. මොකද, මෙවැනි පන්නයේ කුමන්ත්‍රණකාරී ආණ්ඩු පෙරළි ලෝක ඉතිහාසයේ කවර ඉරණමක් එම රාජ්‍යයන්ට අත්පත් කොට දී තිබේද? ඒ නිසා මෙවැනි පන්නයේ ආණ්ඩු පෙරළි, දේශපාලන කුමන්ත්‍රණ හරහා ආණ්ඩු පෙරළි පොදු ජනයාගේ මහා ලේ ගංගාවක් බවට පත්වීම වළක්වන්න බැහැ. දැනටමත් ජීවිත දෙකක් ඝාතනය වී තිබෙනවා. රටේ විශාල අරාජිකත්වයක් නිර්මාණය වී තිබෙනවා. තවමත් අරාජිකත්වය කෙළවර වෙන්නේ කවර දිශාවෙන්ද කියන එක පිළිබඳව කිසිදු මැන බැලීමකට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මේ අවස්ථාවේදී මේ රටේ ජනතාවත්, අපිත් මේ දේශපාලන කුමන්ත්‍රණය පිළිගන්නවා නම්, නැවත මෙවැනි දේශපාලන කුමන්ත්‍රණයක් සිදුවීමේ ඉඩකඩ තිබෙනවා.

එවැනි දේශපාලන කුමන්ත්‍රණයක් මේ නිශ්චිත මොහොතේදී ලේ ගංගාවක් බවට පත් වුණේ නැත්නම්, ඊළඟ අවස්ථාවේදී

අනිවාර්යයෙන්ම ලේ ගංගාවක් බවට පත්වනවා. එමනිසා මේ දේශපාලන කුමන්ත්‍රණය සිදු වූ මොහොතේ සිටම ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ දේශපාලන කුමන්ත්‍රණය පරාජයට පත් කළ යුතුයි කියන දැඩි ස්ථාවරයක ඉඳ කටයුතු කරමින් සිටියා. මේ දේශපාලන කුමන්ත්‍රණය හරහා ආණ්ඩුව එහෙට මෙහෙට අටවල නතර වුණේ නැහැ. එම නිසා බලහත්කාරයෙන් බලය අරගෙන ඒ බලය හරහා බහුතරය නිර්මාණය කර ගැනීම සඳහා අවස්ථාවක් නිර්මාණය වුණා. මේ රටේ ජනතාවට මේ රටේ දේශපාලකයෝ කවුද, මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ කවුද, මන්ත්‍රීවරු තෝරා එවද්දී එවා තිබෙන මන්ත්‍රීවරු කවුද කියන එක පිළිබඳව ඉතාමත් හොඳ වෙන්දේසි පොළක් ඉදිරිපත් කරනු ලැබුවා. එමනිසා තමන් පාර්ලිමේන්තුවේ කොපමණ කාලයක් හිටියාද, තමන්ට කොපමණ ප්‍රමාණයක් මනාප තිබෙනවාද කියන සංඛ්‍යා දත්ත මත බුරුත කඳන් විකිණෙනවා වාගේ වට අඩි ගණනකට මන්ත්‍රීවරුන්ගේ අලෙවිය තීරණය වෙන්න පටන් ගත්තා. මන්ත්‍රීවරු වෙන්දේසිපොළට ආවා. මේ රටේ අශිෂ්ටත්වයේ දේශපාලනයේ ඔටුනු පළන් යුගයක් බවට මේ යුගය පත්වෙමින් තිබුණා.

මේ කරුණ මම ඉතාමත් අවධාරණයෙන් කියන්න ඕනෑ. දැන් බොහෝ අය කියනවා, එහෙට පනින්න, මෙහෙට පනින්න සල්ලි ගත්තා කියලා. මම අවධාරණය කරන්නේ මෙයයි. පනින්න විතරක් නොවෙයි, ඉන්නත් සල්ලි අරන් තිබෙනවා. මේ තිබෙන්නේ අශිෂ්ට දේශපාලනයක්. අපේ රටේ දියත් වන්න පටන් ගත්තා, අශිෂ්ට දේශපාලනයක්. අපි මේ රටේ පොදු ජනයාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. මෙවැනි අශිෂ්ටත්වයකට පත් වී තිබෙන දේශපාලනය ශිෂ්ටත්වය කරා ගෙන ඒමේ වගකීමක් අපට නැද්ද? වට අඩි ගණනට මන්ත්‍රීවරු තීන්දු වන; ඔවුන්ගේ මිල වෙන්දේසිපොළේ තීරණය වන සංස්කෘතියක් මේ රටේ ගොඩනැගීම මොන තරම් යුක්ති සහගතද? එම නිසා අපේ රටේ මේ අශිෂ්ටත්වයට පත් වී තිබෙන දේශපාලන ක්‍රමය වෙනස් කිරීම සඳහා දිගු අරගලයක් තිබෙනවා.

ඒ අරගලය සඳහා දිගු කාලීන ලෙස මැදිහත් වන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම්ය කියන පණිවුඩයත් මේ වේලාවේ මම දෙනවා. කුමන්ත්‍රණකාරී වුවමනාව වෙනුවෙන්ම තමයි පාර්ලිමේන්තුව කල් දමනු ලැබුවේ. බලහත්කාරයෙන් බලය හදාගෙන ඒ බලය හරහා අමාත්‍ය ධුර ලබා දෙමින්, නියෝජ්‍ය අමාත්‍ය ධුර ලබා දෙමින්, රාජ්‍ය අමාත්‍ය ධුර ලබා දෙමින්, සමහරවිට බිය ගැන්වීම් හරහා, නඩු පෙන්වමින්, ඝසකිි පෙන්වමින්, මුදල් විසි කරමින් මේ අශුද්ධ ක්‍රියාවලිය දියත් වන්නට පටන් ගත්තා. හැබැයි මේ අශුද්ධ ක්‍රියාවලිය ජයග්‍රහණය කරන්න ජනාධිපතිවරයාට හැකියාවක් ලැබුණේ නැහැ. එමනිසා ජනාධිපතිවරයා මොකක්ද කළේ? පාර්ලිමේන්තුව කල් තබා, වෙන්දේසිය විවෘත කිරීමේ කාල පරිච්ඡේදය ආරම්භ කළත්, වෙන්දේසිය හරහා තමන්ගේ වුවමනාව ඉටුකර ගන්න බැරි වුණා. අවසානයේදී මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමකට ලක් කළා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමේදී අපේ ප්‍රධාන අදිටනක් තිබුණා. අපි පිළිගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව තෝරා පත් කර ගෙන තිබෙන්නේ එක ජනවරමකින් බව. ජනාධිපතිවරයාට තිබෙන්නේ තවත් ජනවරමක්. එමනිසා පාර්ලිමේන්තුව එක ජනවරමක් නියෝජනය කරනවා; ජනාධිපතිවරයා තව ජනවරමක් නියෝජනය කරනවා. ජනාධිපතිවරයා තේරෙන්නේත් ජනතාවගේ ඡන්දයෙන්; පාර්ලිමේන්තුව තේරෙන්නේත් ජනතාවගේ ඡන්දයෙන්. එමනිසා දේශපාලන මූලධර්මයක් හැටියට එක ජනවරමක් විසින් තව ජනවරමක් යටත් නොකළ යුතුයි. ජනාධිපතිවරයාගේ ජනවරම විසින් පාර්ලිමේන්තුවේ ජනවරම යටත් නොකළ යුතුයි. හැබැයි, අපේ ව්‍යවස්ථාව ඇතුළේ ජනාධිපතිවරයාට හැකියාව ලැබී තිබුණා, පාර්ලිමේන්තුවේ ජනවරම ඉවත් කරන්න. ඉතිහාසයේ සිදු වූ මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් අපි අසා තිබෙනවා. පාර්ලිමේන්තුවට අවුරුද්දක් ගත වුණාට පසුව ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසුරුවා හැරීමේ බලය තමන්ට අත්පත්කර ගත්තා. මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීමේ ලියුම් තමන්ගේ සාක්කුවට දා ගත්තා. ඒ නිසා

බලහත්කාරී ලෙස ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයක් නිර්මාණය කළා. ඒ ඒකාධිපතිත්වය කෙළවර වුණේ උතුරේත්, දකුණේත් ජනතාව සිවිල් යුද්ධයකට මුහුණ දීමෙනුයි. දකුණේ සිවිල් යුද්ධයකට මුහුණ දීපු දේශපාලන ව්‍යාපාරයක් වන අපට ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම නිසා අපේ සාමාජික සාමාජිකාවන් 60,000කට ආසන්න සංඛ්‍යාවක් විනාශයට පත් වෙච්ච යුගයක අද්දැකීම් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම නිසා මහ විශාල ව්‍යසනයකට මුහුණ දුන් ජනතාවක් උතුරේත් ඉන්නවා. ඒ නිසා උතුරේ ජනතාවටත්, උතුරේ දේශපාලනය නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරයක් වන දෙමළ ජාතික සන්ධානයටත්, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණටත් විශේෂ වගකීමක් තිබෙනවා. මේ වර්ධනය වෙමින් තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්වය පාලනය කළ යුතුයි. මෙයට එරෙහිව සටන් කළ යුතුයි. ඒ අදිටනින් යුතුව තමයි අප මේ සටනට අවතීරණ වී සිටින්නේ. යළි එවැනි යුගයක් මේ රටේ නිර්මාණය වීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය කප්පාදු කිරීමේ දිශාවට යන ගමන අප ආපසු හැරවිය යුතුයි. එය හැරවීමේ අධිෂ්ඨානයෙන් අපි මේ ප්‍රවේශයට අවතීර්ණ වුණා.

ජනාධිපතිවරයා සතුව තිබෙන අසීමිත බලතල අපේ රටේ විශාල ලෙස ව්‍යසනයන් නිර්මාණය කර තිබුණා. මේ විනාශය සඳහා ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරන්න, ඇවිදින කැරකෝප්පුව බවට රට පරිවර්තනය කරන්න, රාජ්‍ය ආයතන මුළුමනින්ම අඩපණ කරන්න, මහජන නියෝජිතයන්ගේ තිබෙන වටිනාකම් මුළුමනින්ම දියකර හරින්න, දේශපාලන පක්ෂ බිලීබාගන්න, අධිකරණය තමන්ගේ අතට ගන්න, පාර්ලිමේන්තුව තමන්ගේ අතට ගන්න - මේ ආදි සියල්ලට - හැකියාවක් ලැබුණා, විධායක ජනාධිපති ධුරයට. ඒ නිසා 2015 ජනවාරි මාසයේ 8වන දා මේ රටේ ජනතාව විශාල බලාපොරොත්තුවකින් යුතුව විධායක ජනාධිපති ධුරය කප්පාදු කිරීම සඳහා වූ, අහෝසි කිරීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සඳහා මැතිවරණයක් පැවැත්වුවා. එයට ජන වරමක් ලැබුණා. එහෙත් ඒ ජනවරමේ අරමුණ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මුළුමනින්ම ඉටුකර

ගන්න බැරි වුණා.

ජනාධිපතිවරයා විසින් තේරුම් ගත යුතුව තිබෙනවා, දහනමවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හරය වී තිබෙන්නේ ජනාධිපතිවරයා සතුව තිබෙන ජන වරමට පාර්ලිමේන්තුවේ ජන වරම යටත් නොකළ යුතුය කියන එක බව. එයයි එහි හරය. කුඹී ඔළුවක තරම් මොළයක් තිබෙනවා නම් ජනාධිපතිවරයාට - ඒ හරය, දහනමවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන හරය, එහි මුඛ්‍ය පරමාරථය තමයි, ජනාධිපතිවරයා සතුව තිබෙන ජනවරම පාර්ලිමේන්තුවේ ජනවරමට යටත් නොකළ යුතුය කියන එක. හැබැයි ජනාධිපතිවරයා කළේ කුමක්ද, ජනාධිපතිවරයා කළ දේ තමයි තමන් සතුව තිබෙන විධායක බලය උපයෝගී කරගෙන පාර්ලිමේන්තුව විසුරුවා හැරීම. එය කිසිසේත් ව්‍යවස්ථාවට අනුරූපී ක්‍රියාදාමයක් නොවෙයි. එය විශේෂයෙන්ම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. මේ රටේ පළමු පුරවැසියා රටේ ජනාධිපතිවරයායි. ඔහු බැඳී සිටින්නේ කුමකටද? රටේ ජනාධිපතිවරයාට තමන්ගේ හිතේ ඇති වන, තමන්ගේ ඔළුවට එන සිතිවිලි අනුව රටක් පාලනය කරන්න අයිතියක් නැහැ. තමන්ගේ ඔළුවේ ඇතිවන මනස්ගාත අනුව රටක් පාලනය කරන්න අයිතික් නැහැ. ජනාධිපතිවරයාට සීමා මායිම් ලකුණු කර දී තිබෙනවා. ජනාධිපතිවරයාට තමන්ගේ පාලනය පිළිබඳ සටහන් කර තිබෙන සීමා මායිම් තිබෙන්නේ ව්‍යවස්ථාව ඇතුළේයි.

ඒ ව්‍යවස්ථාවට අනුරූපී වන පරිදි තමයි ජනාධිපතිවරයා තීන්දු ගත යුත්තේ. ජනාධිපතිවරයා හැසිරිය යුතු වන්නේ. හැබැයි, මේ ජනාධිපතිවරයා අවස්ථා ගණනාවකදීම ව්‍යවස්ථාව කඩලා තිබෙනවා. ඒ අනුව දහනව වන සංශෝධනයේ මූලික හරය වන පාර්ලිමේන්තු ජනවරම ජනාධිපතිවරයාට යටත් නොකළ යුතුයි කියන මූලික හරය ප්‍රතික්ෂේප කරමින් මේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවා. එතැනින් නතර වුණේ නැහැ. මේ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාමාර්ගයට එරෙහිව අධිකරණයට යාම හැරෙන්නට වෙන පිහිටක් අපට තිබුණේ

නැහැ. අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. සියවස් දෙකකට වැඩි ඉතිහාසයක් අපේ අධිකරණ පද්ධතියට තිබෙනවා. ඒ සියවස් දෙකකට වැඩි දිගු ඉතිහාසය ඇති ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධායකයත්, පාර්ලිමේන්තුවත්, අධිකරණයත් එකට භාජනය වෙන නඩුවක් විභාගයට ලක් කරනු ලැබුවා. එක පැත්තකින් විධායකය උපයෝගී කරගෙන පාර්ලිමේන්තු බලය ශූන්‍ය කර තිබෙනවා. පාර්ලිමේන්තුව නිහඬතාවයකට පත් කර තිබෙනවා. අධිකරණය ඒ සඳහා මැදිහත් විය යුතුව තිබෙනවා. ලංකා අධිකරණ ඉතිහාසයේ පාර්ලිමේන්තුවත්, විධායකයත්, අධිකරණයත් එකට ගැට ගැසුණු නඩුවක් දියත් වෙන්න පටන් ගත්තා.

පසුගිය 13වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමා ඇතුළු විනිසුරු මඩුල්ල විසින් ඉතාම ඓතිහාසික තීන්දුවක් ලබාදෙනු ලැබුවා. ජනාධිපතිවරයාගේ අත්තනෝමතික පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය අත්හිටුවීමට භාජනය කරනු ලැබුවා. ඒ අත්හිටුවීමට භාජනය නොවෙන්න මේ පාර්ලිමේන්තුව විවෘත වෙන්නේ නැහැ. මතක තබා ගන්න මේ පාර්ලිමේන්තුව විවෘත වෙන්න ප්‍රධාන සාධකය 13වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙන ලද අත්හිටුවීමේ නියෝග යයි. මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අත්හිටුවීමේ නියෝගය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් වහාම, පක්ෂයක් හැටියට අපි මේ රටට ප්‍රකාශයක් ලබා දුන්නා. ගරු කතානායකතුමනි, අපි ඔබතුමාවත් මුණ ගැසුණා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ කුමන්ත්‍රණයේ පළමු පියවර පරාජයට පත් කරලා තිබෙනවා. මේ කුමන්ත්‍රණයේ දෙවන පියවර සහතික වශයෙන් මේ පාර්ලිමේන්තුවේදී පරාජයට පත් කරන බව මේ රටේ ජනතාවට අපි ප්‍රකාශයට පත් කළා. මේ කුමන්ත්‍රණයේ ඊළඟ පියවර පරාජයට පත් කිරීමේ අවස්ථාව විවෘත වුණේ පාර්ලිමේන්තුවට. 14වැනිදා අපි ඉතා හොඳින් දන්නවා. ජනාධිපතිවරයා 14වැනිදා පාර්ලිමේන්තුව කැඳවන්නේ ස්වකැමැත්තෙන් නොවෙයි. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ අත්හිටුවීමේ නියෝගයේ හේතුව නිසා ඔහු විසින්ම නිකුත් කර තිබෙන ගැසට් නිවේදනයේ ප්‍රතිඵලයක් අනුව

පාර්ලිමේන්තුව කැඳවිය යුතුව තිබුණා. ඔහුට පාර්ලිමේන්තුව යළි කැඳවන්නේ නැතුව සැසිවාරය අවසන් කිරීම සඳහා බලයක් තිබුණේ නැහැ. ඒ නිසා ජනාධිපතිවරයා තමන් විසින්ම නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ ගොදුරක් බවට පත්වුණා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි 14වැනිදා මෙම පාර්ලිමේන්තුව විවෘත කරනු ලැබුවේ. මම දැක්කා, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඉතාම හොඳ ප්‍රකාශයක් කළා. මෙවැනි දේශපාලන අර්බුදකාරී තත්වයකදී ව්‍යවස්ථාව යට යමින් දේශපාලනය උඩ එනවා කියා. ඒ නිසා අද නීතිය ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයට වඩා දේශපාලන ප්‍රශ්නයක් කරළියට ඇවිල්ලා තිබෙනවා.

ඒ නිසා නොවැම්බර් 14වැනිදා දිනය ඉතාමත් තීරණාත්මක දිනයක් බවට පරිවර්තනය විය යුතුව තිබුණා. මොකද, අනිවාර්යෙන්ම 14වැනිදා පාර්ලිමේන්තුවෙන් ඒ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගනු ලැබුවේ නැත්නම්, රාත්‍රි 12.00ට ඊළඟ ගැසට් නිවේදනය අනුව පාර්ලිමේන්තු සැසිවාරය ජනාධිපතිවරයා විසින් අවසන් කරනවා. ඒක අපි දන්නවා. දේශපාලනය, ව්‍යවස්ථාව, මේ සියල්ල මේ කුමන්ත්‍රණය වෙනුවෙන් උපයෝගී කරගෙන තිබෙනවා. ඒ නිසා ඒ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා ධෛර්යය සපයන, කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා පෙනී සිටින අයත් ඒ අවස්ථා උපයෝගී කරගත යුතුව තිබෙනවා, ඒ බරින්ම. කුමන්ත්‍රණකරුවන්ට ව්‍යවස්ථා, නීති, රීති අස්සේ රිංගන්න පුළුවන් නම්, කුමන්ත්‍රණ පරාජයට පත් කරන්න ඉන්න අයගෙන් සදාචාරය බලාපොරොත්තු වෙන්න එපා කියලා මම ඒ ගොල්ලන්ට කියනවා. කුමන්ත්‍රණය අශිෂ්ට නම්, ඒකට එරෙහි සටනේ ශිෂ්ටත්වයේ සීමා මායිම් හොයන්න එපා කියලයි මම ජනාධිපතිවරයාට කියන්නේ. මේක අහගෙන ඉන්න ඕනෑ ජනාධිපතිවරයා. මේ කුමන්ත්‍රණය අශිෂ්ටයි. මේ කුමන්ත්‍රණය සදාචාර විරෝධීයි. මේ කුමන්ත්‍රණය ජනවරමට විරෝධීයි. මේ කුමන්ත්‍රණය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට විරුද්ධයි. මේ කුමන්ත්‍රණය ජනාධිපතිවරයා බැඳී තිබෙන ව්‍යවස්ථාවට පටහැණියි. ඒ නිසා එවැනි කුමන්ත්‍රණයක් කරලා ජනාධිපතිවරයා ඊට පස්සේ කුමන්ත්‍රණය

පරාජයට පත් කිරීමේ ශිෂ්ටත්වයේ හිල් හොයනවා. ජනාධිපතිවරයාට අයිතියක් නැහැ. තවදුරටත් අපේ රටේ ශිෂ්ටත්වයේ හිල් හොයන්න.

ඒ නිසා 14වැනිදා පාර්ලිමේන්තුවේදී මේ කුමන්ත්‍රණය පරාජයට පත් කළ යුතුව තිබුණා. අපි හැම වෙලාවේම ව්‍යවස්ථාව සහ රීතීන් උපයෝගී කරගනු ලැබුවා. අපි මේ පාර්ලිමේන්තුව මෙහෙයවනු ලබනවා. ගරු කතානායකතුමනි, ඔබතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ මූලික වගකිව යුත්තා. පෞද්ගලිකව මම ගත්තොත්, අවුරුදු 18කට අධික කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඉන්නවා. ඉතාමත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු ඉන්නවා. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඉන්නවා. ඔබතුමාත් දීර්ඝ කාලයක් අපේ රටේ දේශපාලනයේ නිරත වන කෙනෙක්. අපි මේ පාර්ලිමේන්තුව රටේ සියලු ජනයාගේ ප්‍රශ්න විසඳන, ජනතාවගේ එකම සටන් වේදිකාව ලෙස පිළිගන්නේ නැහැ. අපි පාර්ලිමේන්තුවට එවැනි උත්තරීතරභාවයක් දෙන්නේත් නැහැ. අපි පාර්ලිමේන්තුව තිබිය යුතු තැන, පාර්ලිමේන්තුවට පැවරී තිබෙන වගකීම, පාර්ලිමේන්තුවේ සීමා මායිම් පිළිබඳව හොඳ ඇගයීමක් තිබෙන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා "අපි සියල්ල පාර්ලිමේන්තුවේ විසඳා ගත යුතුයි; සියල්ල උත්තරීතර මෙතැනය." කියන මිත්‍යා ප්‍රබන්ධවල අපි නැහැ.

එවැනි මිථ්‍යා ප්‍රබන්ධ හදපු අයමයි මේ පාර්ලිමේන්තුව කවර වර්ගයේ ස්ථානයක් ද කියන එක පසුගිය දින කීපය තුළ මේ රටේ ජනතාවට ඔප්පු කරමින් තිබෙන්නේ. හැබැයි අපි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආපු අවුරුදු 18ක කාල පරිච්ඡේදය තුළ උත්සාහ කරමින් තිබෙනවා, මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් මේ පාර්ලිමේන්තුව පාලනයවීම සඳහා තිබෙන ස්ථාවර නියෝග ආරක්ෂා කරගන්න. කථානායක පුටුවේ ඔතැන ඉඳගෙන අවුරුදු තුනහමාරක් ඔබතුමා කථානායකවරයා හැටියටත්, අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියටත් කටයුතු කරලා තිබෙන බව ඔබතුමා දන්නවා. ඔබතුමාගේ හෝ කාර්ය මණ්ඩලයේ කාර්යභාරයන්ට කිසිදු ලෙස අවහිරතාවක් නොකරපු

දේශපාලන ව්‍යාපාරයක් අපි. අපි හැමවිටම මේ පාර්ලිමේන්තුව, මේ පාර්ලිමේන්තුවේ සීමා මායිම්, මේ පාර්ලිමේන්තුවේ වගකීම්, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයේ සීමා මායිම් පිළිබඳ සියලු අවබෝධයන් තිබියදීත්, අපි මේ පාර්ලිමේන්තුවේ පවත්වා ගත යුතු අවම ප්‍රජාතන්ත්‍රවාදී, අවම ශිෂ්ටත්වයේ දේශපාලනයක් පවත්වා ගෙන යෑම සඳහා උත්සාහ කරපු දේශපාලන ව්‍යාපාරයක්.

එමනිසා 14වැනිදා කිසිසේත්ම ස්ථාවර නියෝගවලට පටහැණි, සම්ප්‍රදායන්ට පටහැණි යෝජනාවක් ගෙනාවේ නැහැ. ගරු කතානායකතුමනි, ඔබතුමාට මතකයි. අපි ස්ථාවර නියෝග සකස් කළා. අවුරුදු දෙකකට වැඩි කාලයක් මේ ස්ථාවර නියෝග පිළිබඳව අපි සාකච්ඡා කළා. මේ ස්ථාවර නියෝග පිළිබඳව දවසක විවාදයක් පැවැත්වුවා, අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන හැමදෙනාම මීට පෙර මෙහෙයවුණේ අපි නොමැති කාලයක හදන ලද ස්ථාවර නියෝග අනුවයි. හැබැයි, දැන් අප විසින්ම, මේ වර්තමාන පාර්ලිමේන්තුව විසින්ම, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් විසින්ම අනුමත කරන ලද ස්ථාවර නියෝග තමයි අද තිබෙන්නේ. ඒ ස්ථාවර නියෝගවලට තමයි අපි යටත් වන්නේ.

එමනිසා මේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා අප පසුගිය 14 වැනිදා ඒ ආණ්ඩුව පරාජයට පත් කළ යුතුමයි. එය පරාජයට පත් කිරීම සඳහා ස්ථාවර නියෝගවලට අනුරූපී වන පරිදි අවශ්‍ය වන යෝජනාවක් අපි ඉදිරිපත් කළා. ජනාධිපතිවරයා දිගටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩලා, හඳපානේ ආණ්ඩු හදලා, කරන්න පුළුවන් විකාර රූපී වැඩ ඔක්කොම කරලා, අද ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී මේ යෝජනාව සම්මත වුණාද, නැද්ද කියලා වග විභාගයට ලක්කරමින් තිබෙනවා; ශිෂ්ටත්වය පිළිබඳව ප්‍රශ්න කරනවා. ජනාධිපතිවරයාට ශිෂ්ටත්වය පිළිබඳව ප්‍රශ්න කරන්නවත් අද අයිතියක් නැහැ. අශිෂ්ටම දේශපාලනය, ව්‍යවස්ථාව උල්ලංඝනය කළ දේශපාලනය, නීති කඩපු දේශපාලනය රටට ගෙනැල්ලා, යටි කුමන්ත්‍රණකාරී, 'ඩීල්' සහිත

දේශපාලනයක් රටට ගෙනැල්ලා අද පාර්ලිමේන්තුව ප්‍රශ්න කරන්නට එතුමා පෙළඹිලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, උදේම රැස්වුණු අවස්ථාවේදී අද විශ්වාසභංග යෝජනාවක් ගෙන එන බව අපි 14වෙනිදා උදේම ඔබතුමාට දැනුම් දුන්නා. දැනුම් දුන්නා පමණක් නොවෙයි, එතැනදී අපි ඉතාම පැහැදිලිව පෙන්වා දෙනු ලැබුවා එම යෝජනාව ගෙන එන්නේ කොහොමද කියලා. 135 වෙනි ස්ථාවර නියෝගය අනුව ඉතාමත් පැහැදිලිව සඳහන් කොට තිබෙනවා. මේ ස්ථාවර නියෝග අත්හිටුවිය හැකියි කියලා. එම නිසා අපි ඉස්සෙල්ලාම මොකද කළේ? අපි ඉස්සෙල්ලාම කළ දේ තමයි, පාර්ලිමේන්තුවේ ඉක්මන් යෝජනාවක් ගෙන ඒමට බාධා කරන ස්ථාවර නියෝග අත්හිටුවීමට කටයුතු කිරීම. ඒ ස්ථාවර නියෝග අත්හිටුවීමකින් තොරව ඉස්සරහාට යන්න බැරි බව අපි දැනගෙන හිටියා. ඒ නිසා ගරු එම්. ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් මේ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. කාට හෝ තිබුණා ඒ අවස්ථාවේදී ඒ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පරාජයට පත් කරන්නට හැබැයි, ආණ්ඩුවක් අටවා ගත්තු, සෙල්ලම් ආණ්ඩුවක වැජඹුණු ඒ කිසිවෙකුට කොන්ද පණ තිබුණේ නැහැ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පරාජයට පත් කරන්න. ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව සහ අත්හිටුවන ලද ස්ථාවර නියෝගය මේ පාර්ලිමේන්තුවේ විධිමත් ලෙස සම්මත වී තිබෙනවා. ඔබතුමා දැන් නිල හැන්සාඩ් වාර්තාව නිකුත් කරලා තිබෙනවා. එමනිසා නිශ්චිත පරිදි ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව සම්මත වුණා. අනතුරුව මේ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාවට යටත්ව, ඒ ස්ථාවර නියෝගවලට අනුරූපී වන පරිදි මා විසින් විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළා. අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් එය ස්ථිර කරනු ලැබුවා.

පාර්ලිමේන්තුවක සිදු විය හැකි කටයුතු අතර අයවැය ලේඛනයට නිසි බරක් තිබෙනවා වාගේම විශාල බරක් තිබෙන යෝජනාවක්

තමයි විශ්වාසභංග යෝජනාව. ඒක සෙල්ලම් දෙයක් නොවෙයි. පවතින ආණ්ඩුවක් බිඳවැට්ටීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ලබා දී තිබෙන ඉතාම වැදගත් බලය තමයි විශ්වාසභංගයක් හරහා ආණ්ඩුවක් පෙරළිය හැකි වීම. එමනිසා මේ පාර්ලිමේන්තුව ඇතුළේ විවාදයට ලක් කරනවා නම්, මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරනවා නම් විශ්වාසභංගය තමයි ඉතාමත් වැදගත් යෝජනාව කියලා අපි පිළිගන්නවා. අපි ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. අපි මේ පාර්ලිමේන්තුවේ රෙගුලාසි සම්මත කරනවා. අණපනත් සම්මත කරනවා. රටේ විවිධ ප්‍රශ්න සාකච්ඡා කරනවා. හැබැයි, ඒ ඔක්කෝටමත් වඩා උඩින් තිබෙන බව අපි පිළිගන්නවා ආණ්ඩුවකට එරෙහිව ගෙන එන ලද විශ්වාසභංග යෝජනාව.

ස්ථාවර නියෝගවලට අනුරූපී වන පරිදි අපි මේ විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළා. අපි ඉතාමත් කැමැත්තෙන් හිටියා මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව හොඳ විවාදයක් කරන්නට. විවාදයක් අවශ්‍යයි. මොකද, ආණ්ඩුවක් බලයෙන් නෙරපා හැරීම සඳහා ගෙන එන ලද යෝජනාවට නිකම්ම අත ඔසවනවා වෙනුවට අපි ඉතාමත් කැමැත්තෙන් හිටියා මේ පාර්ලිමේන්තුවේදී විශ්වාසභංග යෝජනාව විවාදයට ලක් කරන්නට. ඒ මොකද, මා ඉදිරිපිටම තමයි මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා වාඩි වෙලා හිටියේ. ඒ විශ්වාසභංගය ගෙනෙන වෙලාවේ දී එතුමා අගමැතිවරයා. එය සම්මත වුණාට පසුව ඒ තනතුර නැතිව යනවා. ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉදිරිපිටම ඔහුගේ ක්‍රියා කලාපයන් සහ ඔහුගේ පාලනය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට මට කාලාන්තරයක් තිස්සේ වුවමනාවක් තිබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිබඳ අපට කථාවක් තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තුවෙන් හිටියා විශ්වාසභංගය දවසේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපිට ඒ කථාව කරන්න.

ඒ වාගේම අවුරුදු තුනහමාරක පාලනය ගැන කිවුවාම, 2015 ජනවාරි 8වැනිදා එක්සත් ජාතික පක්ෂය ගොඩනැගෙන්නේ එක්සත්

ජාතික පක්ෂය ඇතුළේම තිබෙන ශක්‍යතාවක ප්‍රතිඵලයක් හැටියට නොවෙයි. කවුරු හරි එසේය කියා විශ්වාස කරනවා නම්, වැරදියි. ජනවාරි මාසයේ 8වැනිදා ප්‍රතිඵලය එක්සත් ජාතික පක්ෂය අත්පත් කරගෙන තිබෙන ශක්‍යතාවයේ ප්‍රතිඵලයක් නොවෙයි. ඒක ඉතා හොඳින් පෙන්නුම් කරනවා. ඊට පෙර තිබුණු පළාත් සභා මැතිවරණ සියල්ලකම ඡන්ද ප්‍රතිඵල එකතු කළත්. ජනාධිපති ඡන්දයට පෙර තිබුණු සියලු පළාත් සභා මැතිවරණවල ඡන්ද ප්‍රතිඵල එකතු කළත් ලක්ෂ 30 ඉක්මවන්නේ නැහැ. මේක තමයි ඇත්ත. මොකක්ද ඒක පිටුපස තිබුණේ? ඒක එක්සත් ජාතික පක්ෂයේ වුවමනාව නොවන බව එක්සත් ජාතික පක්ෂය තේරුම් ගත යුතුව තිබුණා. එදා ජනවාරි මාසයේ 8වැනිදා හැටදෙලක්ෂයක ජනතාවගේ විශාල ජනවරමක් තිබුණා. ඒ ජනවරමේ අපේක්ෂාවන් තිබුණා. ඒ ජනවරමේ අපේක්ෂාව මුළුමනින්ම කණපිට හරවමිනුයි කටයුතු කරමින් තිබුණේ. ඒ ජනවරම ලබා දීලා තිබුණේ වංචාවට එරෙහිව, හැබැයි වංචාවේ යෙදුණා.

ජනවාරි මාසයේ 10වැනිදා ආණ්ඩුව හදනවා. පෙබරවාරි මාසයේ 27වැනිදා තමයි දින 50කට මත්තෙන් තමයි ආණ්ඩුව කුප්‍රකට බැඳුම්කර මංකොල්ලය සිද්ධ කළේ. මේ ආණ්ඩුව දින 50ක් යන කොට ජන වරමට පිටුපාන්න පටන් ගත්තා. එතැනින් නතර වුණේ නැහැ. අයවැය ලේඛන, සියල්ලකම යෝජනා කරමින් තිබුණේ මොකක්ද? 1977 දියත් කරන ලද වැරදි ආර්ථික ප්‍රතිපත්තිය තව තවත් ඉදිරියට ගෙන යමින්, විනාශකාරී, කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තියේ ගමන්මඟ තමයි, තමුන්නාන්සේලා තීරණය කරලා තිබුණේ. ඒ ජන වරමට ප්‍රතිපක්ෂව තමයි කටයුතු කරමින් තිබුණේ.

ඒ විතරක් නොවෙයි විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ මාස 18කට වඩා වැඩි කාලයක් වැසීම නිසා දෙමව්පියෝ පාරට ඇවිල්ලා, ආචාර්යවරු පාරට ඇවිල්ලා, ශිෂ්‍යයෝ පාරට ඇවිල්ලා ඉන්න කොට ඒ ප්‍රශ්නය පිළිබඳ මේ ආණ්ඩුව අනුගමනය කළේ කවර ප්‍රතිපත්තියක්ද? රාජිත සේනාරත්නගේ යම් පෞද්ගලික වුවමනාව මත තමයි **SAITM**

ප්‍රශ්නය මෙතරම් කාලයක් ඇදගෙන යමින් තිබුණේ. එම ප්‍රශ්නයේදී ආණ්ඩුවක් ලෙස නොවෙයි කටයුතු කළේ. තම තමන්ගේ පෞද්ගලික වුවමනාවන් මත මුළුමනින්ම ජනවරමට පටහැණිව තමුන්නාන්සේලා කටයුතු කරන්න පටන් ගත්තා.

තමුන්නාන්සේලා සිංගප්පූරු ගිවිසුම අත්සන් කළේ කොහොමද? සිංගප්පූරු ගිවිසුම අත්සන් කරන කොට කැබිනට් මණ්ඩලයට ලබාදෙන ලද අනුමැතිය තමයි, ඒ ගිවිසුම පිළිබඳ සාකච්ඡා කොට නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමත කිරීම. නමුත්, එවැනි නැවත ඉදිරිපත් කිරීමක් කළේ නැහැ. ජනවාරි මාසයේ පළාත් පාලන මැතිවරණ කාලයේ, ඒ පිළිබඳව ජනතාවගේ අවධානයක් යොමු නොවන කාලයේ තමන්නාන්සේලා හොර රහසේ මේ ගිවිසුම අත්සන් කළා. මේවා මලික් සමරවික්‍රම හිටපු අමාත්‍යවරයාගේ හෝ හිටපු අග්‍රාමාත්‍යවරයාගේ - රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික දේපොළක් නොවෙයි. ඔවුන්ගේ දේපොළ පවරා දීම පිළිබඳ ප්‍රශ්න නම්, ඔවුන්ගේ ව්‍යාපාර පවරා දීම් පිළිබඳ ප්‍රශ්න නම්, අපට ප්‍රශ්නයක් නැහැ. මේවා හඳපානේ කළත් කමක් නැහැ. ඊ පානේ කළත් කමක් නැහැ.

හැබැයි, මේ රටේ ජනතාවගේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑම සඳහා තිබෙන මාවත් මුළුමනින්ම මංකොල්ලකන විධියට තමයි කටයුතු කරමින් තිබුණේ. හම්බන්තොට වරායේ ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව කැබිනට් මණ්ඩලයේ තීරණය කුමක්ද? හම්බන්තොට වරාය ගිවිසුම අත්සන් කරන්න පෙර පාර්ලිමේන්තුවේ විවාදයක් කරලා, එම විවාදයේදී ඉදිරිපත් වන සාධනීය යෝජනාද ගිවිසුමට ඇතුළත් කරලා අත්සන් කළ යුතුව තිබුණා. සිකුරාදා දිනයක පාර්ලිමේන්තු විවාදය පැවැත්වීමට තීරණය කරලා, ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සෙනසුරාදා දිනයට යොදාගෙන තිබුණා. පාර්ලිමේන්තුව තුළ කුමන සාධනීය විවාද ද? මොකක්ද කළේ? තක්කඩි, හිතුවක්කාර ලෙස තමයි එදාත් හම්බන්තොට වරාය ගිවිසුම අත්සන් කළේ?

තමුන්නාන්සේලා හම්බන්තොට වරාය ගිවිසුම අත්සන් කරලා ඉවර වෙලා තමයි හම්බන්තොට වරාය මිලදී ගන්නා ලද චීන සමාගමට ක්ෂේත්‍ර ගණනාවක් සඳහා අවුරුදු ගණනාවකට - අවුරුදු 28, 35, 40, ආදී වශයෙන් - බදු අහෝසි කිරීමේ ගැසට් නිවේදනය මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ. හම්බන්තොට වරායට මිලක් නියම කරලා, විකුණන්න තීරණය කරලා විකුණනවා. වික්කාට පස්සේ ඒ සඳහා බදු සහන දෙනවා. අපි එදාත් ඒ පිළිබඳව ඇහුවා. ඒ බදු සහන තමුන්නාන්සේලා ගෙදරින් ගෙනැල්ලා දෙන ඒවා නොවෙයි. ඒ බදු සහනවල වටිනාකම ගිවිසුමට ඇතුළත් කළාද? ඒ කිසිවක් කළේ නැහැ. එමනිසා තමුන්නාන්සේලාගේ අවුරුදු තුනහමාරක ආණ්ඩුව කටයුතු කරමින් තිබුණේ ජනතාවට මුළුමනින්ම ප්‍රතිපක්ෂ ලෙස සිටග නිමිත්තයි.

එදා ඉදිරිපත් කළ විශ්වාසභංග යෝජනාව පිළිබඳව විධිමත් විවාදයක් පැවැත්වුවා නම්, ඉතාමත් අසීරුතාවට පත් වී තිබෙන රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව පිළිබඳවත් එතුමාට ඇහෙන්න අපට ලොකු කථාවක් කියන්න තිබුණා. අඩුම තරමින් එදාවත් සිහි බුද්ධියෙන් අහයි කියලා අපි හිතුවා. ඊට කලින් තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරු, මේ රටේ ජනතාව, පාර්ලිමේන්තුව කියන කිසි හඬකට ඇහුම්කන් නොදුන් නායකයෝ ඒ ගොල්ලෝ ප්‍රජාතන්ත්‍රවාදයේ මුරකරුවෝ නොවෙයි. ඒ ගොල්ලෝ තනතුර ගහලා ගියාට පස්සේ, තමන් දේශපාලන වශයෙන් විනාශ වුණාට පස්සේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සටන්පාඨ පෙරට ගන්න එක වැරැදියි. ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ තමන්ගේ කැත, කිලිටි ශරීරය වසා ගැනීම සඳහා තිබෙන කඩමල්ලක් නොවෙයි. ඒ පිළිබඳවත් එදා අපි විශ්වාසභංග යෝජනාව පිළිබඳව විවාදයේදී කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. එම නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා පිළිබඳවත්, මහින්ද රාජපක්ෂ මහත්මයා පිළිබඳවත්, මෙම විවාදය අහගෙන ඉන්නවා නම් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ක්‍රියා කලාපය පිළිබඳවත් පසුගිය 14වැනිදා මේ පාර්ලිමේන්තුව තුළ අපි විධිමත් විවාදයක්

බලාපොරොත්තු වුණා. හැබැයි එම විවාදය කරගන්න බැරි වුණා. එම විවාදය කරගන්න බැරි වීම හේතු කොටගෙන, ඒ වාගේම පාර්ලිමේන්තුවේ සිදු නොවිය යුතු තත්වයක් තුළ තමයි එම විශ්වාසභංග යෝජනාව ඡන්ද විමසීමකට භාජනය කරනු ලැබුවේ. නමින් නමට ඡන්දය විමසන ලෙස අපි ඉල්ලා සිටියා. නමින් නමට ඡන්දය විමසීමට සූදානම් බව ඔබතුමා අවස්ථා තුනකදී කියනවා මම හැන්සාඩ් වාර්තාවේ දැක්කා. හැබැයි කිසිදු අවස්ථාවක එම ඡන්දය මේ පාර්ලිමේන්තුව තුළ නිල වශයෙන් ප්‍රකාශයට පත්වීම වැළැක්වීම තමයි එම කණ්ඩායමට අවශ්‍ය වී තිබුණේ. එසේ ප්‍රකාශයට පත්වීම වැළැක්වීම වෙනුවෙන් ඔවුන් නැවතත් කඩාකප්පල්කාරී ක්‍රියාව අනුග මනය කළා.

ඒ කුමන බාධක මධ්‍යයේ හෝ ජනතාව විසින් මේ ව්‍යවස්ථාදායකයට පවරා තිබෙන බලය, ජනතාවගේ පරමාධිපත්‍ය බලය ඉතා වැදගත් කොට පාර්ලිමේන්තුව නියෝජනය කරනවා නම්, ජනතාවගේ එම පරමාධිපත්‍ය බලයේ වැදගත් කොටස ඉටු කර ගැනීම සඳහා 14වැනිදා, 15වැනිදා සහ 16වැනිදා කථානායකවරයා හැටියට ඔබතුමා විසින් ගනු ලැබූ තීන්දු තීරණ නිසා අපට ඔබතුමාව පැසසුමට භාජනය කළ හැකිව තිබෙනවා. ඉතා වැදගත් තීරණයක්. ඒ සම්බන්ධ හැන්සාඩ් එක නිකුත් වී තිබෙනවා. ඒකෙදී ඉතාමත් පැහැදිලි ලෙස විශ්වාසභංග යෝජනාව සම්මත වී තිබෙනවා. විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පස්සේ මොකක්ද මෛත්‍රීපාල සිරිසේන මහතාට මේකේ හිල් හොයන්න තිබෙන අයිතිය මොකක්ද? මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට මේකේ වංගු ගහන්න තිබෙන අයිතිය මොකක්ද? මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මේ විශ්වාසභංග යෝජනාව හරියට සම්මත වුණාද, නැද්ද කියලා වග - විභාග කරන්න තිබෙන අයිතිය? මේ පාර්ලිමේන්තුවේ ඡන්දයක් නිසි පරිදි සිදු වුණාද නැද්ද කියලා වග විභාග කිරීමේ ප්‍රධානියා කථානායකතුමා. කථානායකතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ තීන්දු - තීරණ, වග - විභාග පිළිබඳව ඉන්න

ප්‍රධාන වගකිව යුත්තා. මේ පාර්ලිමේන්තුව විධායකට යටත් කරලා නැහැ. ජනාධිපතිවරයාට යටත් කරලා නැහැ. ඒක නිසා ඉතා පැහැදිලි ලෙස ඔබතුමා 15වැනිදා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරනු ලැබුවා, විශ්වාසභංගය විධිමත් සේ සම්මත වුණු බවත්, ආණ්ඩුවක් නොමැති බවත්, මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරනු ලැබුවා.

විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පස්සේ මොකක්ද ජනාධිපතිවරයාට කරන්න තිබෙන්නේ? ජනාධිපතිවරයාට නැවතත් කියන්නේ මේ කාරණයයි. එතුමාගේ ඔළුවේ හැදෙන හිතළුවලට පුළුවන්, පොළොන්නරුවේ කුඹුරක් වගා කරන්න. එයාට හිතුණොත් බාස්මතී ගහමු කියලා බාස්මතී ගහන්න පුළුවන්. එයාට හිතුණොත් සති දෙකෙන් යූරියා ගහන්න ඕනෑ කියලා, යූරියා ගහන්න පුළුවන්. එයාට හිතුණොත් රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර දාන්න පුළුවන් කියලා, ඒක කරන්න පුළුවන්. තමන්ගේ කුඹුරක් වගා කරන්න පුළුවන් තමන්ගේ ඔළුවේ හැදෙන හිතළුවලට. හැබැයි, ජනාධිපතිවරයාට ජනාධිපතිකමේ වගකීම් ඉටු කරන්න බැහැ, තමන්ගේ හිතළුවලට. ජනාධිපතිවරයා යටත් මේ ව්‍යවස්ථාවට. ජනාධිපතිතුමා මොකක්ද කරලා තිබෙන්නේ?

මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුවක් පෙරළීම සඳහා අවශ්‍ය වෙන අවස්ථා තුනක් පිළිබඳව ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙනවා. පළමුවැනි එක තමයි, පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාව. එතුමා ආවේ නැහැ, ප්‍රතිපත්ති ප්‍රකාශය කියවන්න. අපි බලාගෙන හිටියා, එතුමා එදාට ප්‍රතිපත්ති ප්‍රකාශය කියවන්න එයි කියලා. මොකද මේ පාර්ලිමේන්තුවට එන්න ඕනෑ ඇඳුම් ඇඳගෙන. ඒක නිසා එතුමා ආවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා.

"පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළ හොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සම්මත කළ හොත් එවිට ද

අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේය."

තව මොනවාද ජනාධිපතිවරයාට කරන්න තිබෙන්නේ? මේ ජනාධිපතිවරයා ඊයේත් කැබිනට් මණ්ඩලය කැඳවනවා. මෙහෙම ආණ්ඩු තියාගෙන යන්න පුළුවන්ද? මේක අලි බබා සහ හොරු හතළිහ වාගේ නේ. අලි බබායි හොරු හතළිහයි එකතු වෙලා කියනවා, "අද බැංකුවකට ගහමු. අද තව තැනක් හොරකම් කරමු." කියලා. මේ වාගේ ආණ්ඩු කරගෙන යන්න පුළුවන්ද? ව්‍යවස්ථාවට අනුව, නිශ්චිත පරිදි පාර්ලිමේන්තුව විශ්වාසභංගයක් සම්මත වූ වහාම කැබිනට් මණ්ඩලය විසුරුවා හැරෙන්නේය කියා තිබෙනවා.

ජනාධිපතිවරයා ඒක කරන්න ඕනෑ. ඊළඟට ජනාධිපතිතුමා කරන්න ඕනෑ මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48වැනි ව්‍යවස්ථාවෙහි කියනවා, "ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70වැනි ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසුරුවා හැර නැත්නම් 42 වන, 43 වන, 44 වන, සහ 45 වන ව්‍යවස්ථාව අනුව අග්‍රාමාත්‍යවරයෙක්ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ද, නියෝජ්‍ය අමාත්‍යවරයන්ද පත් කළ යුත්තේය." කියලා. දැන් එතුමාට වෙන මොකුත් නැහැ. පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාව සම්මත වුණාට පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරී තිබෙන්නේ, නව ආණ්ඩුවක් පිහිටුවීම. එතුමාට ඕනෑ නම් රාජපක්ෂ මහත්මයාත් එක්කම හුරතල් වෙන්න, ආයෙත් එතුමා දිවුරුම් දුන්නාට අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ව්‍යවස්ථාව එක. පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාවක් සම්මත වුවාට පසුව ජනාධිපතිවරයාට පැවරී තිබෙන බලතල තමයි, ආණ්ඩුව විසුරුවා හැර නව ආණ්ඩුවක් පත් කිරීම. පසුගිය 18වනදා සිට දැන් සැලකිය යුතු කාලයක් ගත වෙමින් තිබෙනවා. මේ කාලය ඇතුළත ජනාධිපතිවරයා විසින් ආණ්ඩුවක් පත් කරලා නැහැ. දැන් ජනාධිපතිවරයාට මේ රටේ ජනතාව බල කරන්න ඕනෑ, ආණ්ඩුවක් හදන්න. එතුමාට ව්‍යවස්ථාවෙන් දීලා

තිබෙනවා, - විශ්වාසභංග යෝජනාවක් සම්මත වුණාට පසුව එතුමා ආණ්ඩුවක් පිහිටුවන්න ඕනෑ. දින 10ක් තිස්සේ දැන් ආණ්ඩුවක් නැහැ. ඒ නිසා මේ අරාජිකත්වයේ කුමන්ත්‍රණකාරයා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා. එතුමාට අවශ්‍ය නම්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සයනයේ සැතපීමම තමයි වඩාත් වැඩි උත්තේජ ජනක හැඟීම් හදන්නේ කියලා හිතනවා නම්, නැවතත් ඕනෑ නම් මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති ලෙස දිවුරුම් දෙන්න; නැවත කැබිනට් මණ්ඩලය පත් කරන්න. නැවත අපි ඒක පාර්ලිමේන්තුවෙන් බලා ගන්නම්. හැබැයි දැන් ආණ්ඩුවක් නැහැ. ජනාධිපතිවරයා තමන්ට පැවරී තිබෙන කාර්යභාරය දැන් ඉටු කරන්නේ නැහැ. ඉටු කරන්නේ නැතුව හොර මණ්ඩලයක් රැස් වෙනවා වාගේ, කැලෑ ආණ්ඩුවක් රැස් වෙනවා වාගේ කැබිනට් මණ්ඩලය රැස් වෙනවා. තීන්දු ගන්නවා; තීන්දු ප්‍රකාශයට පත් කරනවා.

අපි මේ රටේ සියලු රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ - මේ කැබිනට් මණ්ඩලය තවදුරටත් වලංගු කැබිනට් මණ්ඩලයක් නොවෙයි. කිසිදු රාජ්‍ය නිලධාරියෙක් මේ කැබිනට් මණ්ඩලය විසින් ගනු ලබන කිසිදු තීන්දු තීරණයක් ක්‍රියාත්මක නොකළ යුතුයි කියලා. ඒ මොකද? මේ රටේ ව්‍යවස්ථාව රකින්න හැම රාජ්‍ය සේවකයාම දිවුරුම් දී තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ත්‍රිවිධ හමුදාවට, පොලිසියට විශාල කාර්ය භාරයක් පැවරෙනවා. මෙවැනි අරාජික තත්වයක් ඇතුළේ හමුදාව, පොලිසිය ව්‍යවස්ථාවේ ආරක්ෂාවේ ආරක්ෂකයන් වෙනුවෙන් ව්‍යවස්ථාව ආරක්ෂා කරන්නන්ගේ ආරක්ෂාව වෙනුවෙන් තමයි හමුදාව සහ පොලීසිය පෙනී සිටින්න ඕනෑ. හමුදාව සහ පොලීසිය පෙනී සිටිය යුතු වන්නේ, ව්‍යවස්ථාව කඩන අයගේ ආරක්ෂාව වෙනුවෙන් නොවෙයි. ඒ නිසා හමුදාව සහ පොලීසිය තවදුරටත් හැසිරිය යුතු වන්නේ, ජනාධිපතිවරයාගේ නියෝග මත නොවෙයි කියලා අපි යෝජනා කරනවා. ඇයි, හමුදාව, පොලීසිය බැඳී සිටිනවා. ව්‍යවස්ථාව රකින්න. ඔවුන් ආරක්ෂා කළ යුත්තේ ව්‍යවස්ථාව රකින අය. ඔවුන්

ආරක්ෂා කළ යුතු නැහැ, ව්‍යවස්ථාව කඩන අය. ජනාධිපතිවරයාත්, වර්තමාන ඊනියා කැබිනට් මණ්ඩලයත් ව්‍යවස්ථාව කඩලා තිබෙන්නේ. ඒ නිසා මේ රටේ ආරක්ෂක හමුදාවන්ට විශාල කාර්යභාරයක් තිබෙනවා. මේ රටේ ව්‍යවස්ථාව කඩන ලද කණ්ඩායමක් ආරක්ෂා නොකළ යුතුයි කියලා මේ රටේ හමුදාවෙන්, පොලිසියෙන් සහ රාජ්‍ය සේවයෙන් අපි විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේදී ඉල්ලා සිටිනවා.

ඒ නිසා මේ අරාජිකත්වය නිර්මාණය කිරීමේ ප්‍රධානම කුමන්ත්‍රණකරුවා මෛත්‍රීපාල සිරිසේන මහත්මයායි. හැබැයි එතුමා කුමන්ත්‍රණය විවිධාකාරයෙන් වසා ගැනීම වෙනුවෙන් එක එක පක්ෂ සමග සාකච්ඡා, පක්ෂ නායකයන් සමග සාකච්ඡා - මම දන්නවා. අදත් කවුරුහරි මන්ත්‍රීවරයෙක් සමග සාකච්ඡා කළා ලු මම දන්නේ නැහැ. මොනවා කරනවාද කියන්න. සර්ව පාක්ෂික සාකච්ඡා - තවදුරටත් අපට නම් මේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක කිසි සාකච්ඡාවක් ඉතුරු වී නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සාකච්ඡා කළ යුතු වන්නේ, තමන්ගේ හදවත සමග; තමන්ගේ හෘදය සාක්ෂිය සමග. ව්‍යවස්ථාවට අනුව කටයුතු කළාද, නැද්ද, ජන වරමට අනුව කටයුතු කළාද, නැද්ද කියන එක තමයි එතුමා වග විභාගයට ලක් කරන්න ඕනෑ වන්නේ. අපිව ගෙනැල්ලා මොනවාද සාකච්ඡා කරන්නේ? හෘදය සාක්ෂියක් නැති කෙනෙකුට මේ රට පිළිබඳව, රටේ ජනතාව පිළිබඳව කිසිදු හැඟීමක් නැති කෙනෙකුට සාකච්ඡාවලින් ඇති ඵලය මොකක්ද? ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එක එක්කෙනාට ගිල්ලවන කුඩා කුඩා ලුණු ජනතා විමුක්ති පෙරමුණ ගිලින්න සූදානම් නැති බවත් මම ජනාධිපතිවරයාට මෙතැන ඉඳන් මතක් කරන්න කැමැතියි. ව්‍යවස්ථාව උල්ලංඝනය කරපු මෙවැනි ජනාධිපතිවරයෙක් - ව්‍යාවස්ථාව උල්ලංඝනය කරන ලද ජනාධිපතිවරයෙකුට එරෙහිව ගත හැකි ව්‍යවස්ථානුකූල ක්‍රියාමාර්ගත් ව්‍යවස්ථාවේම සඳහන් වී ඇති බව මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මම මතක් කර දෙන්න කැමැතියි. මතක තබා ගන්න. දෙකක් තිබෙනවා. දැනුවත්වම ව්‍යවස්ථාව උල්ලංඝනය. ඊළඟට, මානසික ආබාධ. මේ දෙකටම විශ්වාස භංග

යෝජනාවක් ගෙනෙන්න පුළුවන්. මම දන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්තයට වලංගු වෙන්නේ මොකක්ද කියලා; මේ රටේ ජනතාව තීරණය කරයි. ව්‍යාවස්ථාවේම තිබෙනවා. ව්‍යවස්ථාව කඩනවා නම් ජනාධිපතිවරයාට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග. ඒ ක්‍රියාමාර්ගවලින් කවර යෝජනාව ගත හැකිද කියලා අපි ඉදිරියේදී කල්පනා කරලා බලමු. ඒකට අපි සූදානම්. අපට මේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑ ඇයි? මේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවීම නිසා විශාල ලෙස පීඩාවට පත් වුණු බැට කාපු දේශපාලන ව්‍යාපාරයක් අපි. ඒ නිසා අපේ පක්ෂය මේ නිශ්චිත මොහොතේ දේශපාලනය කරමින් තිබෙන්නේ - අපේ පක්ෂයේ කිසිදු සාමාජිකයෙක් හෝ අපේ රටේ කිසිදු පුරවැසියෙක් හෝ රාජ්‍ය ත්‍රස්තවාදයේ ගොදුරු බවට පත් නොවිය යුතුයි, කියන එක තමයි අපේ ස්ථාවරය. අපි හැම පියවරක්ම ගනු ලබන්නේ ඒ සඳහායි. මේ රටේ කවර දේශපාලන ක්‍රියාකාරිකයෙක් හෝ මේ රටේ මාධ්‍යවේදියෙක් හෝ මේ රටේ සාමාන්‍ය පුරවැසියෙක් හෝ යළි රාජ්‍ය ත්‍රස්තවාදයේ ගොදුරක් බවට පත් නොවිය යුතුයි. අන්න ඒ නිසා තමයි මේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීමේ පෙරටුගාමී කාරය භාරයක් ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉටු කර තිබෙන්නේ.

මෙතැනදී අපි කිසිසේත්ම එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කිරීමක් කරන්නේ නැහැ. මම ඒකත් වගකීමෙන් කියන්නේ. මොකටද, එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරන්නේ? අවුරුදු තුනහමාරක් වන ඔවුන්ගේ කැත, කිලිටි ඉතිහාසය, මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන ලෝගුවෙන් වහගන්න ඉඩ නොදිය යුතුයි. ඒකත් මේ රටේ ජනතාවත් එක්ක ඉදිරියේදී සාකච්ඡාවට බඳුන් කරන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානමින් ඉන්නා බව මතක් කරන්න කැමැතියි. අවුරුදු තුනහමාරක කැත, කිලිටි ඉතිහාසයක් තිබෙන්නේ. මේ පසුපෙළ මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවොත් ඔවුන්ගේ හෘදය සාක්ෂිය කියයි, ආණ්ඩුව කටයුතු කළේ කොහොමද, ආණ්ඩුව කළේ මොනවාද, කරපු ඒවාට එකඟද, ඨරදමච එක සාකච්ඡා කරපු ඒවා තීන්දු බවට පත් වුණාද, එම

තීන්දු ක්‍රියාත්මක කරන්න මොන ඇමතිවරයාද මැදිහත් වුණේ කියන එක. පොළොන්නරුවේ මන්ත්‍රීවරයා ඇවිල්ලා කියන කොට, "පොළොන්නරුවේ ජනතාව කියන්නේ මේකයි" කියලා හම්බන්තොට මන්ත්‍රීවරයා ඇවිල්ලා කියන කොට, "හම්බන්තොට ජනතාව කියන්නේ මේකයි" කියලා ඒ කිසිවක් සැලකිල්ලට ගන්නේ නැතුව කොල්ලුපිටියේ මොළවලින් තමයි රටක් ගෙනියන්න හැදුවේ. ඒක තේරුම් ගත යුතුව තිබෙනවා. ඒ මොළ අසාර්ථක වීමෙන් තමයි මේ කුමන්ත්‍රණය දියත් කිරීම සඳහා පසුබිමක් නිර්මාණය වුණේ. ඒකත් හොඳින් තේරුම් ගත යුතුව තිබෙනවා. ඒවා පිළිබඳව වෙනම කථා කරමු.

දැන් රට මේ තරම් විශාල අරාජිකත්වයකට පත් කරලා මේ තරම් විශාල අස්ථාවරත්වයක් නිර්මාණය කරලා මේ තරම් ව්‍යවස්ථාව කැඩීමේ ක්‍රියාමාර්ගයකට මේ දෙදෙනා ඇතුළු වුණේ ඇයි? මහින්ද රාජපක්ෂ මහත්මයා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. එතුමාගේ කතාවේදී කිවුවා, ළමයා කාලයේ මේකේ ඉඳගෙනත් හිටියා කියලා. මම දන්නේ නැහැ ඇත්තද කියන්න. එහෙමත් කිවුවා. එතුමා මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා; අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා; විපක්ෂ නායකවරයෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා; අග්‍රාමාත්‍යවරයෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා; ජනාධිපතිවරයා හැටියට කටයුතු කරලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ආපසු මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා. ආයෙත් හොර අගමැති කෙනෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුට ලබා ගත හැකි - කථානායක පුටුව හැරුණු කොට අනෙක් - සියල්ල අරගෙන තිබෙනවා. එතුමා එහෙම කරලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තු භාවිතා පිළිබඳව එතුමාට යම් අත්දැකීමක් සහ අවබෝධයක් තිබෙනවාය කියලා මා පෞද්ගලිකව විශ්වාස කරනවා.

සාමාන්‍යයෙන් අඹ ගස්වල අඹ හැදුණාම ඉදුණු අඹ ලේන්නු

කනවා. ලේන්නු කෑවාට පසුව ඉතුරු වෙන කැල්ලට අපේ ගම්වල කියනවා, "ලේන් කොටේ" කියලා. ගමේ ඉන්නා දරුවෙකුටවත් ලේන් කොටේ කන්න දෙන්නේ නැහැ. ඒකේ විස ඇති කියලා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්මයා මේ 'අගමැති කොටේ' ගත්තේ ඇයි? මේ, අගමැති කොටයක්නේ, ගත්තේ. මම දැක්කා, "ඉතා හොඳට මල් වට්ටියක් අතේ තිබුණු මහින්ද රාජපක්ෂ මහත්මයාට අසුචි වට්ටියක් දුන්නා" කියලා කුමාර වෙල්ගම මන්ත්‍රීවරයා කියා තිබුණා. ඇයි, එහෙම වුණේ? ඊළඟට පළාත් සභා මැතිවරණය ඒමට නියමිතව තිබුණා; ඊළඟට ජනාධිපතිවරණයක් ඒමට නියමිතව තිබුණා. ඒ සඳහා අවශ්‍ය අණපනත් මේ පාර්ලිමේන්තුවේ ඇති තරම් සාකච්ඡා කරමින් තිබුණා. නිසි පරිදි මැතිවරණ ක්‍රියාදාමයක් හරහා ඔහුට අවශ්‍ය නම්, බලය සඳහා යන්න තිබුණු පාරක් තිබුණා. ඒ පාර එසේ තිබියදී මේ ලේන් කොටයක් වැනි "අගමැති කොටය" ගන්න මොකක්ද පෙළඹුවේ?

පාර්ලිමේන්තුවේ දැන් ආණ්ඩුවක් හදා ගෙන තිබෙන බව කියනවා. මේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන ප්‍රධාන කාර්ය භාර දෙකක් තිබෙනවා. එක, නීති සම්පාදනය. දෙක, මූල්‍ය සම්පාදනය. පාර්ලිමේන්තුවට පැවරී තිබෙන ප්‍රධාන කාර්ය භාර දෙක අනුව පළමුව මේ රටේ පොදු ජනයා වෙනුවෙන් නීති හදන්න ඕනෑ. දෙවනුව, මේ මහජනයාගේ ධනය භාණ්ඩාගාරයේ තිබෙනවා. භාණ්ඩාගාරයේ තිබෙන ඒ ධනය බලා ගන්න ඕනෑ, පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් තොරව කිසිදු මුදලක් වියදම් කරන්න ජනාධිපතිවරයාට හෝ මහින්ද රාජපක්ෂ මහත්මයාට බලයක් නැහැ. මේ කාර්යයන් දෙකම මේ පාර්ලිමේන්තුවට කරගන්න බැහැ. මේ කණ්ඩායමට පුළුවන්ද නීතියක් සම්පාදනය කරගන්න? මේ පාර්ලිමේන්තුවේ මේ කණ්ඩායමට පුළුවන්ද, අයවැය ලේඛනයක් සම්මත කරගන්න. මුදල් පනතක් සම්මත කරගන්න? කිසිවක් සම්මත කරගන්න බැහැ. ඒ නිසා මේ ආණ්ඩුව අටවා ගත්තේ, පාර්ලිමේන්තුවේ කාර්යභාරය සඳහා නොවෙයි. පාර්ලිමේන්තුවේ කාර්යභාරය නම් - බහුතරය නැහැ කියන කොටම ගෙදර යන්න

ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ කාර්යභාරය නොවෙයි. පාර්ලිමේන්තුවට පැවරී තිබෙන කිසිදු කාර්යභාරයක් මේ ආණ්ඩුවට කරගන්න බැහැ.

සම්ප්‍රදායයක් හැටියට තේරීම් කාරක සභාවේ බහුතරය ආණ්ඩුවට තිබෙනවා. හැබැයි, බහුතරයක් නැති ආණ්ඩුවට තේරීම් කාරක සභාවේ බහුතරය හම්බවෙන්නේ නැහැ. මෙහෙමයි වෙලා තිබෙන්නේ. සම්ප්‍රදායයක් ලෙස කථානායකවරයා පත් කිරීමේ බලය තිබෙනවා. හැබැයි, එහෙම බලයක් හරහා කථානායකවරයා පත් කරන්න හෝ ඉවත් කරන්න බලයක් නැහැ. ඒ නිසා මේ අබ්බගාත ආණ්ඩුවක් ගත්තේ ඇයි? මේ කඩා වැටුණු පාලනයකට අත තිබ්බේ ඇයි? මේ ආණ්ඩුවේ කිසිදු අපේක්ෂාවක් නැහැ. මේ පාර්ලිමේන්තු කාර්යභාරය ගැන; මේකේ අණපනත් සම්මත කරන්න; මේකේ මුදල් ලේඛන සම්මත කරන්න කිසි අභිලාෂයක් නැහැ. ඒ අභිලාෂය නැති බව මේ පාර්ලිමේන්තුව රැස් වුණු හැම දිනයේම පෙන්නුම් කරමින් තිබුණා.

මේ පාර්ලිමේන්තුව ඔවුන්ට තවත් තමන්ගේ තක්කඩි කැත මර්දනකාරී දේශපාලනයේ එක් මධ්‍යස්ථානයක් විතරයි. පුටු කඩන, කථානායකවරයාගේ පුටුව පෙරළන, මිරිස් කුඩු ගෙනෙන - මෙවැනි කැත පන්නයේ- වුවමනාවකට විතරයි මේ පාර්ලිමේන්තුව ඒ ගොල්ලන්ට ඕනෑකර තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට ජනතාව විසින් පවරා තිබෙන නිත්‍ය වූ බලය හරහා මුදල් සම්පාදනයත්, නීති සම්පාදනයත් ඒ ගොල්ලන්ට මේ පාර්ලිමේන්තුවේ කර ගන්න බැහැ. එහෙම නම් මේ පාර්ලිමේන්තුවේ වැඩ ගොඩක් කරගන්න බැරිව තිබියදී ආණ්ඩුවක් හදා ගත්තේ ඇයි? එසේ කළේ පාර්ලිමේන්තුවේ කාර්ය භාරයට නොවෙයි. අධිකරණ පද්ධතියේ දියත් වෙමින් තිබෙන නඩු ප්‍රමාණයක් තිබෙනවා. ඉතා වේගයෙන් ඒවා ඉස්සරහට ඇවිල්ල තිබෙනවා.

ගෝඨාභය රාජපක්ෂට ඇවන්ට්ගාර්ඩ් ගනුදෙනුව හරහා රජයට ලබා දිය යුතු රුපියල් කෝටි 1,140ක් සම්බන්ධයෙන් වන නඩුවක් තිබෙනවා. බැඳුම්කර ගනු දෙනුවට අදාළ මුදල කෝටි 1,100යි. මේකත්

ඊට සමානම එකක්. ඒ සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂටත් තවත් හය දෙනකුටත් එරෙහිව තිබෙන නඩුව දෙසැම්බර් මාසයේ අධිකරණයේ විභාගයට ගැනෙනවා.

සාමාන්‍යයෙන් මේ රටේ ඕනෑම පුරවැසියකු තමන්ගේ අම්මාගේ, තාත්තාගේ සොහොන හදන්නේ දුක් විඳලා කුලී වැඩක් කරලා හෝ තමන්ගේ සල්ලිවලිනුයි. නමුත් එවැනි සදාචාරයක් නැති දේශපාලනඥයින් හැටියට ගෝඨාභය රාජපක්ෂලා මහජනයාගේ සල්ලි හොරකම් කරලා මැදමූලනේ ඇටෙව්වා කෞතුකාගාරයක් කියලා සොහොනක්. ඒකට රාජ්‍ය මුදල් ලක්ෂ 339ක් වියදම් කරලා තිබුණා. ඒ විතරක් නොවෙයි ඒ මුදල් වියදම් කළ බව පිළිගෙන, නඩුව දැම්මාට පසුව මුදල් ගෙනැල්ලා භාර දුන්නා. එහෙම නම් දැන් හොරුත් ඉන්නවා; බඩුත් තිබෙනවා. නමුත් මේ ගොල්ලන් නඩුව ඇහුවේ නැහැ. වෙන වෙන ඩීල් දාගෙන හිටියා. ඒවා මම වෙන දවසක කියන්නම්. සාගල රත්නායක මන්ත්‍රීතුමා මොනවාද කළේ? ඒවා වෙනම කථා කරන්න ඕනෑ. මේ ගොල්ලන් කරපුවා අපි මේ පාර්ලිමේන්තුවේ කියන්නම්. තිලමෙලා ආරක්ෂා කරපු විධිය; ගාමිණී සෙනරත්ලා ගෙවල්වල හංගාගෙන හිටපු විධිය අපි කියන්නම්. එහෙමයි වංචනිකයන් ආරක්ෂා කළේ. පසුපෙළ මන්ත්‍රීවරුන් මේවා දැනගන්න ඕනෑ. ආණ්ඩු නොවෙයි, මේ ගොල්ලන් කළේ. ආණ්ඩුව එනකොට ඒ ගොල්ලන්ට මහ බලයක් ආවායි කියලා කිවුවා. තමන්ට අවුරුදු ගණනාවක් තිස්සේ අත්පත් කර ගන්න බැරි වුණු දේපොළ අත්පත් කර ගැනීම, අවුරුදු ගණනාවක් තිස්සේ ලබා ගන්න බැරි වුණු ජීවිත සුබ විහරණය ලබා ගැනීම; සන්තර්පණය කිරීම තමයි ආණ්ඩුවක් හැටියට කළේ. ගෝඨාභය රාජපක්ෂට එරෙහි ඊළඟ නඩුව අහන්න විශේෂ අධිකරණය දින නියම කර තිබෙනවා. ගෝඨාභයට නඩු දෙකයි; නාමල් රාජපක්ෂට නඩු දෙකයි; බැසිල් රාජපක්ෂට නඩු දෙකයි; විමල් වීරවංශටත් නඩුවක්; වීරවංශගේ බිරිඳටත් නඩුවක් තිබෙනවා. එතැනත් නඩු දෙකයි. ඊළඟට මහින්දානන්දට

නඩුවක් තිබෙනවා. රෝහිත අබේගුණවර්ධනට නඩුවක් තිබෙනවා. ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ නඩුව, ගාමිණී සෙනරත්ගේ නඩුව, ලලිත් වීරතුංග සම්බන්ධ ඇපැල් නඩුව තිබෙනවා. ඒ ඇපැල ගිය විධියත් මම දන්නවා. ඒක මම වෙනත් දවසක කියන්නම්.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ පුටුව වටේ වට වෙලා හිටපු කට්ටිය මම දැක්කා. විසිදැලක් දාලා **FCID** එකට ඔක්කෝම අල්ලා ගන්න තිබුණා. එහෙම තමයි **team** එක. පෙබරවාරි මාසයට කලින් මේ නඩු ඔක්කොම එනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ විධිමත් ලෙස නීති සම්පාදනය, විධිමත් ලෙස මුදල් සම්පාදනය කර ගැනීම වෙනුවෙන් නොවෙයි මේ ආණ්ඩුව හැදුවේ. මේ ආණ්ඩුව හැදුවේ අන් කවරක්වත් නිසා නොවෙයි. අධිකරණවලින් දියත් වෙමින් තිබෙන නඩු අහන්න ඕනෑ. මේ සතියේ විමල් වීරවංශගේ එක නඩුවක් ආවා. ඒක කල් ගියා මැයි 6ට. අවුරුද්දට දෙපාරයි නඩුව අහන්නේ. නඩුව හතළිස් වතාවක් ඇහුවොත් වීරවංශට 70යි. එතකොට නඩු අහයිද? මේක තමයි ඕනෑ වෙලා තිබෙන්නේ. ඒ වුවමනාව තමයි තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ මහත්මයා දැනුවත්ව හෝ නොදැනුවත්ව කුමන්ත්‍රණකාරී ලෙස හෝ කුමන්ත්‍රණයකට හසුවෙමින් පය තිබ්බේ වටේ ඉන්න අයගේ නඩු බේරා ගැනීම වෙනුවෙන්. ඒකේ ප්‍රතිඵලය අපි දැක්කා. පසුගිය ජනාධිපතිවරණයේදී අපරාධ පිළිබඳව විශාල ලෙස පරීක්ෂණ සිදු වෙමින් තිබුණා ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ පරීක්ෂණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දියත් කරමින් තිබුණා. ඒකේ එක පියවරක් එනවා. හමුදා නිලධාරියකු ගාවට. ඒ පියවර පැන්නාම ගෝඨාභය ගාවට. මම ඒක සහතික කරනවා. හැබැයි, ඒ පියවර පනින්න දෙන්නේ නැහැ. ඊළඟට, තාජුඩීන්ගේ ඝාතනය පිළිබඳව **Defender** රථයක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ සුදු පාට **Defender** රථය අයිති වෙන කොහේටවත් නොවෙයි. රතුකුරුස සංවිධානයයි. රතුකුරුස සංවිධානය විසින් ඒ **Defender** රථය ත්‍යාග යක් හැටියට සිරිලිය ශිරන්ති රාජපක්ෂ වෙත භාර දෙන ඡායාරූප අපි ගාව තිබෙනවා. අන්න ඒ **Defender** රථය තාජුඩීන්ගේ ඝාතනයට

සම්බන්ධ වුණා කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයා ගෙන තිබෙනවා. මේ ක්‍රියාවලිය ඉස්සරහට ගියොත් කවුද අහු වෙන්නේ? ශිරන්ති රාජපක්ෂ. මතක තබා ගන්න මේ ගොල්ලන් ඒ අය අත්අඩංගුවට ගන්නේ නැහැ. මේ ගොල්ලන් කැබිනට් මණ්ඩලයේ කථා කරලා ගත්තු තීරණය මොකක්ද? මේ ගොල්ලන් කැබිනට් මණ්ඩලයේ කථා කරලා "ශිරන්ති රාජපක්ෂ මහත්මිය කියන්නේ ලංකාවේ හිටපු පළමුවැනි කාන්තාව පළමුවැනි කාන්තාව අත්අඩංගුවට ගන්න හොඳ නැහැ" කියලා කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා. දැන් කියන්න එන්න එපා. මා දන්නවා කථාව. එහෙම තමයි කැබිනට් මණ්ඩලයේ තීරණ ගත්තේ. ඒක මතක තබා ගන්න. අත්අඩංගුවට ගන්නේ නැහැයි කියලා තීරණයක් ගත්තා. එතකොට චමල් රාජපක්ෂ මහත්මයා තමයි කථානායකවරයා වශයෙන් සිටියේ. **FCID** එකෙන් එන්න කිවුවා කටඋත්තරයක් ගන්න. (සෝෂා කිරීම්) කටඋත්තරය ගන්න දවසේ මහින්ද රාජපක්ෂ මහත්මයා කථා කළා, ඒ වෙලාවේ අගමැති වශයෙන් සිටි රනිල් වික්‍රමසිංහ මහත්මයාට. කථා කරලා ඇහුවා, " ශිරන්ති නෝනා **FCID** එකට එවන්න ඕනෑමද?" කියලා. මොකක්ද කිව්වේ? " **FCID** එකට යවන්න එපා. නෝනා කියන තැනට මා **FCID** එක එවන්නම්" කියලා කිවුවා. එහෙමයි යැව්වේ කථානායකතුමාගේ ගෙදරට. මේවා බේරා ගත්ත විධිය මතක තබා ගන්න.

මේ නඩු පිළිබඳවත් ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය පිළිබඳවත්, තාජුඩීන්ගේ ඝාතනය පිළිබඳවත්, ඒ වාගේම කිත් නොයාර්ට පහර දීම පිළිබඳවත්, නාමල් නැමැති මාධ්‍යවේදියාට පහර දීම පිළිබඳවත් පරීක්ෂණ විශාල ප්‍රමාණයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිදු කරමින් තිබුණා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු කළේ දේශපාලන නායකත්වයෙන් අවශ්‍ය වන ආශීර්වාද ලබා දෙමින් නොවෙයි. දේශපාලන නායකත්වය කටයුතු කළේ පරීක්ෂණවලට බාධා කරන්නයි; පරීක්ෂණ යට ගහන්නයි. හැබැයි ඒ වෙලාවේදීත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කෙළින් සිටියා. ඒ වෙලාවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

පොලිස් දෙපාර්තමේන්තුව තමන්ගේ අතට අරගෙන කරපු පළමුවන රාජකාරිය මොකක්ද? අපි දැන ගන්න කැමැතියි. පළමුවන රාජකාරිය මොකක්ද කියලා. මාරු කළ පළමුවන පොලිස් නිධාරියා කවුද? මාරු කරන්න උත්සාහ කරපු පළමුවන පොලිස් නිලධාරියා තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහත්මයා. මේ පරීක්ෂණ සියල්ලම කළේ ඔහුයි. ඒක මතක තබා ගන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පළමුවන රාජකාරිය තමයි අපරාධ පිළිබඳ පරීක්ෂණ කරන ලද නිලධාරියා ඉවත් කිරීම. දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා හිටගෙන ඉන්නේ කාගේ පැත්තේද? ජනවාරි මාසයේ 08වන දා ඡන්දය ලැබුණේ ඝාතකයන්ට එරෙහිවයි. අද මෛත්‍රීපාල සිරිසේන හිටගෙන ඉන්නේ ඝාතකයන්ගේ පැත්තේයි. මේ වුවමනාව වෙනුවෙන් තමයි ආණ්ඩුව ඇටෙව්වේ. වෙන කිසි වුවමනාවක් මේ ආණ්ඩුවට තිබුණේ නැහැ. එතුමාගේම කණ්ඩායම කියනවා. "අපරාදෙ දිගටම යන්න තිබුණා. අපට හොඳ ආණ්ඩුවක් ගන්න තිබුණා. මේකට කර ගැහුවේ ඇයි?" කියලා. එතුමාගේම කණ්ඩායම අපට එහෙම කියනවා. ඒකයි මා කියන්නේ අපරාධ, වංචා, දූෂණ චෝදනාවලින් මිදීමේ වුවමනාව තිබුණා.

මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපති පුටුවේ වාඩිවෙලා මුල් කාලයේදී -මෙතැන පක්ෂ නායකයින් ඉන්නවා - විධායක සභාව රැස් වුණා. ඒ විධායක සභාව මා නියෝජනය කළා. 2015 අප්‍රේල් මාසයේ 10වන දා විධායක සභාව රැස් වුණා, ජනාධිපති ලේකම් කාර්යාලයේදී. එයට අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත්, රිසාඩ් බදියුදීන් මහත්මයා ඇතුළු පක්ෂ නායකයිනුත් සහභාගි වුණා. ඒ වෙලාවේ මා ජනාධිපතිවරයාගේ මුහුණට කිව්වා, "ඔබතුමා මෙතැනට ඇවිල්ලා ඉන්නේ රජයේ වාහනයෙන්, රජයේ රියැදුරු සමග. රජයේ තෙල් ගහගෙනයි. අග්‍රාමාත්‍යවරයා මෙතැනට ඇවිල්ලා ඉන්නේ, ආණ්ඩුවේ වාහනයෙන්, ආණ්ඩුවේ රියැදුරු සමග, ආණ්ඩුවෙන් තෙල් ගහගෙනයි. මා මෙතැනට ඇවිල්ල ඉන්නේ පක්ෂයේ වාහනයෙන්, පක්ෂයෙන්

වියදම් කරගෙනයි. අපි කිසිවක් ගන්න නොවෙයි ආවේ" කියලා. ජනවාරි මාසයේ 08වන දා ලැබුණු ජන වරමට අනුව කටයුතු කරන්න කියලා විනාඩි 20කට වඩා වැඩි කාලයක් තුළ මා එදා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ප්‍රකාශ කළා. "ඔබ ගමන් කරමින් තිබෙන්නේ ඉතාමත් වැරැදි දිශාවකටයි කියලා මා එතුමාට කිව්වා. එහෙම කිව්වේ මේ ඇතක නොවෙයි බලය අරගෙන මාස දෙකහමාරකට පසුවයි, එතුමාගේ ක්‍රියා කලාපය ඒ මාස දෙකහමාර ඇතුළත අපි දැක්කා. මේ පක්ෂ නායකයින් එයට සාක්ෂි දරයි. මා කණගාටුවට පත්වෙනවා, එදා මට එය **record** කර ගන්න බැරි වුණු එක ගැන. මා මෙය **record** කර ගන්න ඕනෑය කියලා එතුමාට කියලා **record** කර ගන්නවා. ඒක මතක තබා ගන්න. එදා මා පෙන්වා දුන්නා. අප්‍රේල් මාසයේ 10වන දා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මා කිව්වා, "ඔබ ගමන් කරමින් සිටින්නේ මේ දිශාවටයි" කියලා. හැබැයි මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොකක්ද කළේ? අප්‍රේල් මාසයේ 10වන දායින් පස්සේ විධායක සභාවක් කැඳවුයේ නැහැ. ඔච්චරයි කළේ. මේ ගමන් මගේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දිගින් - දිගටම, පියවරෙන් - පියවර ගමන් කරමින් තිබුණේ අන් කවර දිශාවකටවත් නොවෙයි. තමන්ට ඒ පුටුවේ නැවත වාඩි වීමේ අභිලාෂයෙන්. දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ?

මේ අටවා ගන්නා ලද ජාතික ආණ්ඩුව - මේකට ජාතික ආණ්ඩුව කියලා කියන්නේ කවුද? ලෝකයේ ජාතික ආණ්ඩු හැදිලා තිබෙනවා. ඒ ජාතික ආණ්ඩුවලට තිබෙනවා, ජාතික න්‍යාය පත්‍රයක්. මා දැන ගන්න කැමැතියි 2015 සැප්තැම්බර් මාසයේ 02වන දා අටවා ගන්නා ලද ජාතික ආණ්ඩුවේ ජාතික න්‍යාය පත්‍රය මොකක්ද කියලා. මේ අවුරුද්දට මේ වැඩ ටික කරනවා. මේ අවුරුද්දට මේ වැඩ ටික කරනවා කියලා ජාතික න්‍යාය පත්‍රයක් තිබුණාද? එහෙම ජාතික න්‍යාය පත්‍රයක් තිබුණාද? කිසි ජාතික න්‍යාය පත්‍රයක් තිබුණේ නැහැ. තිබුණු එකම ජාතික න්‍යාය පත්‍රය තමයි, දහනව වන ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා සංශෝධනය අනුව ඉන්න පුළුවන් වන්නේ අමාත්‍යවරුන් 30 දෙනකුට පමණක් වුණත් ඒ සංඛ්‍යාව 48 දෙනකු දක්වා වැඩි කර ගත් එක. දෙගොල්ලන්ට තිබුණු ජාතික වුවමනාව තමයි අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කර ගන්න එක. ඒ අමාත්‍ය ධුර සංඛ්‍යාව 48 දක්වා වැඩි කර ගත්තා. එම නිසා මේ ජාතික ආණ්ඩුව කියන අටමගලය අටවා ගත්තේ රට වෙනුවෙන් නොවෙයි, තමන්ගේ පංගු පේරුව බේරා ගන්නයි; තමන්ගේ බලය, පංගුව බේරා ගන්නයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට තමන්ගේ කැබිනට් මණ්ඩලයේ බල පංගුව බේරා ගන්නයි. රනිල් වික්‍රමසිංහ මහත්මයාට පාර්ලිමේන්තුවේ තමන්ගේ බල පංගුව බේරා ගන්නයි. බල පංගුවේ පොරයක් විතරයි. ජාතික ආණ්ඩුවකට ජාතික න්‍යාය පත්‍රයක් තිබෙන්න ඕනෑ. "මේ අවුරුදු පහට අපි ජාතික ආණ්ඩුවක් හදනවා. මේ අවුරුදු පහ තුළ අපි මේ වැඩ ටික කරනවා"යි කියලා එහෙම න්‍යාය පත්‍රයක් තිබුණාද? ඒකට තමයි ජාතික ආණ්ඩු කියලා කියන්නේ. මේවා ජාතික ආණ්ඩු නොවෙයි; අවජාතක ආණ්ඩුයි. මේවාට ජාතික ආණ්ඩු කියලා කියන්නේ කවුද?

බල පොරය එතැනින් දියත් වුණා. බල පොරයේ කෙළවර බවට පත්වෙලා තිබුණේ අන් කවරක්වත් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ජනාධිපති පුටුවේ නැවත වාඩි වීමේ වුවමනාව. මේ නොපෑහෙන මඟුල සිද්ධ වෙන්නේ වංචා, දූෂණ, අපරාධ වසා ගැනීමේ වුවමනාවත් නැවත සිහසුනේ විරාජමාන වීමේ වුවමනාවත් නිසයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මේ වුවමනාව විතරයි මේක එකතු වෙන්න තිබෙන්නේ. වෙන මොනවාද තිබෙන වුවමනා. ඊට අමතරව මොනවාද තිබෙන්නේ? ජනවරමට එකඟද? මහින්ද මහත්මයාට ඡන්ද ලක්ෂ 58ක් ලැබුණේ, මෛත්‍රීපාල මහත්මයාට එරෙහිවයි. මෛත්‍රීපාල මහත්මයාට ඡන්ද ලක්ෂ 62ක් ලැබුණේ මහින්ද මහත්මයාට එරෙහිවයි. එහෙම නම් මේ එක්කෝටි විසිලක්ෂයක්ම මේ එකතුවට විරුද්ධයි. මේක ජනවරමට පටහැණියි; මේක ව්‍යවස්ථාවට පටහැණියි; මේක නීතිවලට පටහැණියි; මේක සදාචාරයට පටහැණියි. මේ දෙන්නා අතර තිබෙන බැඳීම මොකක්ද? මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඡන්දයෙන්

පසුව අවස්ථා ගණනාවකදී කිවුවා, "ජනවාරි මාසයේ 8වැනි දින ඡන්ද ප්‍රතිඵල ඇහුවේ හැංගිලා" කියලා. දොඩංගස්ලන්දේ පොල්වත්තක හැංගිලා ඡන්ද ප්‍රතිඵල ඇහුවේ කිවුවා. ලෝක ඉතිහාසයේම ජනාධිපතිවරයෙක් පොල්වත්තක හැංගිලා ඡන්ද ප්‍රතිඵල ඇහුවා නම්, ඒ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා. කාට බයේද? බස්සන්ට බයේද, භූතයන්ට බයේද? පොල්වත්තේ හැංගුනේ මොකටද? මහින්දට බයේ. ඒක තේරුම් ගන්න ඕනෑ. ඇයි? මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අවස්ථා ගණනාවකදී කිව්වා මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කළා නම් එතුමා ඝාතනය වන බවත්, එතුමාගේ දරුවන් ඝාතනය වන බවත්, එතුමාගේ බිරින්දෑව ඝාතනය කරන බවත්, මේ පොළොවේ අඩි හයක් වැළලෙන බවත් එතුමා කිව්වා. මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කළා නම් එතුමාත්, එතුමාගේ බිරිඳත්, එතුමාගේ දරුවොත් වැළලෙන්නේ මොකක් නිසාද? අකුණු ගහලාද, ගංවතුරට අහුවෙලාද? ඒක තේරුම් ගන්න ඕනෑ. මගේ නොවෙයි, ඔහුගේ වචනවලින්. එතකොට මේ ඝාතකයායි, ඝාතනය වෙන්න ඉන්න කෙනයි එකතු වෙන්නේ කොහොමද? අපට සූත්‍රය කියලා දෙන්න. මේ එකතු වීමේ සූත්‍රය මොකක්ද? ජනවරමට පටහැණි නම්.

ඒ විතරක් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මේ දේශපාලන වේදිකාවේ අපි ඕනෑ තරම් කථා කරමින් තිබෙනවා. හැබැයි, අපි කිසි කෙනෙකු ඔහුගේ නමේ උච්චාරණය උපයෝගී කර ගන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සතුව තිබෙන්නේ ග්‍රාමීය නමක් නම් අපි ඔහුගේ නමට අගෞරව කරලා නැහැ. ඔහුගේ හැසිරීමට අපි අගෞරව කරලා නැහැ. ඔහුගේ වචන උච්චාරණය අපි දන්නවා. අපේ රටේ ප්‍රාදේශීය භාෂාවන් තිබෙනවා. එකිනෙකා තමන්ට අවශ්‍ය පරිදි වචන උච්චාරණය කරනවා. හැබැයි, රාජපක්ෂ කඳවුර මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ප්‍රහාරයට උපයෝගී කර ගත්තේ මොනවාද? "හිටන්, හුටන්, පඹයා." මොනවාද මේ කියන්නේ? දේශපාලනයෙන් ගත හැකි අවලාදම පන්න දේශපාලනයක් තමයි

මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට එරෙහිව අනෙක් කඳවුරේ තිබුණේ. එම කඳවුරත් එක්ක මෛත්‍රීපාල සිරිසේන මහත්මයා යළි විවාහ වෙන සූත්‍රය කුමක්ද? ඒ කාරණයයි අපිට දැන ගන්න තිබෙන්නේ. එම නිසා ලංකා ඉතිහාසයේ අශිෂ්ටත්වයේ දේශපාලනයේ ඔටුනු පළඳාගෙන ඉන්නේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයායි.

මෙවැනි අශිෂ්ට තැනකට අපේ රටේ දේශපාලනය ගමන් කර තිබෙනවා. එම නිසා මේ ගමනේ වුවමනාව තිබෙන්නේ අන් කවරකවත් නොවෙයි. මේ වුවමනාවේ අදිටන තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට නැවත ජනාධිපති පුටුවේ වාඩි වෙන්නත්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ වංචා සහ දූෂණ වළක්වා ගැනීමත්. එමනිසා දෙදෙනෙකුගේ පෞද්ගලික වුවමනාවන් වෙනුවෙන් මේ රට විනාශ කළ යුතුද? විනාශ කිරීමට ඉඩ දිය යුතුද? ඉඩ දිය යුතු නැහැ. මේ රටේ ප්‍රතිරූපයට වෙලා තිබෙන හානිය බලන්න. අපි පිළිගන්නවා බටහිර රාජ්‍යයන්ට, වෙන රාජ්‍යයන්ට ලෝකය පුරා තමන්ගේ ආර්ථික දේශපාලන න්‍යාය පත්‍රයන් තිබෙනවා. ඒවා පිළිබඳව හොඳ අවබෝධයක් අපට තිබෙනවා. ඒවාගේම අපි පිළිගත යුතුව තිබෙනවා ලෝකය වෙළඳපොළෙන් ගැට ගැහිලා තිබෙනවා. රාජ්‍යතාන්ත්‍රික බැඳීම්වලින් ගැට ගැහිලා තිබෙනවා, විවිධ ජාත්‍යන්තර සංවිධානවලට ගැට ගැහිලා තිබෙනවා. ලෝකයේ කිසි රටකට තනි ලෙස හුදෙකලා ලෙස ජීවත් වෙන්න පුළුවන් කියලා කල්පනා කරනවා නම් මේ යුගයේ ඔහුගේ මොළය පරීක්ෂා කර ගත යුතුව තිබෙනවා. එමනිසා ලෝකය හමුවේ ඉතාම නිර්භය, අභිමානවත් ජාතියක් ලෙස පෙනී සිටින්න පුළුවන්කම තිබෙන්නේ කුමකින්ද? ඒ අපි අභිමානවත් ලෙස අපේ රට පාලනය කරන්න සමත් නම් විතරයි. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, මානව හිමිකම් මූලධර්ම, ජනතාවගේ වුවමනාවන්, කුමන්ත්‍රණකාරී නොවන දේශපාලනය, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන එක තමයි රට ලෝකය හමුවේ හදන ප්‍රතිරූපය. මතක තබා

ගන්න. හැබැයි මේ ප්‍රතිරූපය අද මුළුමනින්ම විනාශයට භාජනය කොට තිබෙනවා.

දෙදෙනෙකුගේ තක්කඩි වුවමනාවට ලෝකය ඉදිරියේ අපේ රට මේ තරම් හෑල්ලුවට භාජනය විය යුතුද? මේ රටේ ජීවත් වෙන්නේ රාජපක්ෂයි. මෛත්‍රීපාලයි විතරක් නම් අපි අහක බලාගෙන ඉන්නම්. හැබැයි, මේ රටේ අපිත් ජීවත් වෙනවා. අපේ උපන්, නූපන් දරු පරම්පරාවක් මේ රටේ ජීවත් වෙනවා. එමනිසා ලෝකය හමුවේ අපේ රට අභිමානවත් රාජ්‍යයක් කියන කොඩිය ඔසවා තැබීමේ වගකීමක් අපට තිබෙනවා. තමන්ගේ පෞද්ගලික වුවමනාව මත මෛත්‍රීපාලටයි, රාජපක්ෂටයි ඒ කොඩිය උඩ ජරා කරන්න පුළුවන්කම ලැබුණාට, මේ රටේ ජනතාව ලෝකය ඉදිරියේ අපට අභිමානවත් ජාතියක් ලෙස ඇතිවී තිබෙන ප්‍රතිරූපය බිඳ වට්ටන්න ඉඩකඩ ලබානොදෙන බවට අපි මේ රටේ ජනතාවට සහතික කරනවා. ඒ විතරක් නොවයි, මේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය බරෙන් ගන්න ඕනෑ. කුමන්ත්‍රණකාරී ලෙස ආණ්ඩු හදනවා නම් ඡන්ද මොකටද? දැන් එතුමාම ප්‍රකාශයට පත් කරලා තිබෙනවා ජනවාරි මස පස්වැනි දින ඡන්දයක් කියලා. දැන් ඒක කරන්න ලැබෙන්නේ නැහැ. නමුත් ජනවාරි මාසයේ පස්වැනි දින ඡන්දයක් තියලා හයවැනි දින ආණ්ඩුවක් හදා ගත්තොත් ජනතාව තීන්දු කරනවා බහුතරය තිබෙන මේ කණ්ඩායමට ආණ්ඩුව හදන්න කියලා. මෛත්‍රීපාල මහත්මයාට හිතෙනවා ඒ කණ්ඩායම මට අල්ලන්නේ නැහැ. මම වෙන කණ්ඩායමක් එක්ක ආණ්ඩුව හදනවා කියලා. මොකක්ද ඡන්දවලින් ඇති ඵලය. මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති පුටුවේ වාඩිවීම නිසා අමන්දානන්දයට පත්වී සිටින අයගෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ අපට දේශපාලන ප්‍රතිපත්ති තිබෙන්න පුළුවන්. අපි හැමදෙනාටම දේශපාලන ව්‍යාපාර අනුව බලය ලබා ගැනීමේ වුවමනාවන් තිබෙන්න පුළුවන්. හැබැයි, අපි බලය ලබාගත යුත්තේ කවරාකාරයෙන්ද? කවර මූලධර්ම මත පදනම්වද? මේ මූලධර්මය මත පදනම්ව රාජපක්ෂ මහත්තයා බලය ගත්තොත්, ඒක

පිළිගන්නවා නම් ජනවාරි මාසයේ පස්වෙනිදා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ඡන්දය පැවැත්වූවා නම් හයවැනිදා හැදෙන ආණ්ඩුවටත් එතුමාට කියන්න පුළුවන් "බහුතරය පාර්ලිමේන්තුවේ හිටියාට මට වැඩක් නැහැ. මගේ ඔළුවේ හැදිලා තිබෙන චිත්‍රය මෙයා. එයා තමයි අගමැති" කියලා. මේ සෙල්ලම අපි අනුමත කරන්න ඕනෑද? මේ සෙල්ලම මේ රටේ ජනතාව අනුමත කළ යුතුද?

ඒ නිසා පසුගිය 26වැනිදා ලබාදීලා තිබෙන මෙම තීරණය ආපසු හැරෙව්වේ නැත්නම් අපේ රටේ පාර්ලිමේන්තු මැතිවරණවලින් තවදුරටත් පලක් නැහැ. ඡන්ද මොකටද? එහෙම නම් කරන්න තිබෙන්නේ, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා හඳ පායන දවසට මේසය ළඟට ඇවිල්ලා තීන්දුවක් ගන්නවා, "අගමැති කවුද" කියලා, පත් කරලා දාන්න. ඡන්දවලින් ආණ්ඩු පිළිගන්නේ නැත්නම් මොකටද මෛත්‍රීපාල මේ රටේ මැතිවරණ පවත්වන්නේ අපි අහන්නේ එච්චරයි. ඒ විතරක් නොවෙයි පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ තීරණයට ඉඩ දුන්ණොත් ජනාධිපතිවරයාට ඕනෑම වෙලාවක පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන්. පස්වෙනිදා ආණ්ඩුව හදලා හය වෙනිදා පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන්. ඒ බලයත් දෙන්න ඕනෑද? ඒ නිසා අපි තරග වදින්නේ මේ කුමන්ත්‍රණයේ තිබෙන වැදගත්ම කරුණු දෙකකටයි. ඒ, තමන්ගේ හිතලු අනුව ආණ්ඩු හදන්න බැහැ කියන එකත්, තමන්ගේ හිතලු අනුව පාර්ලිමේන්තුව විසුරුවා හරින්න බැහැයි කියන එකත්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ තිබෙන මේ කරුණු දෙක මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ අයිතියක් ලෙස පිළිගත්තොත්, ජනාධිපතිවරයාගේ අයිතියක් ලෙස පිළිගත්තොත්, තවදුරටත් මේ රටේ ඡන්ද වැඩක් නැහැ. පාර්ලිමේන්තු වැඩක් නැහැ. එහෙම නම් තිබෙන්නේ, ජනාධිපතිවරයාට තුණ්ඩු ඇදලා පාර්ලිමේන්තුවක් හදා ගන්නයි. මූලධර්ම දෙකක් උල්ලංඝනය කරලා තිබෙනවා. මේ මූලධර්ම දෙක උල්ලංඝනය කිරීම රාජපක්ෂ මහත්තයාට මේ වෙලාවේ සතුට දනවනවා වෙන්න පුළුවන්. හැබැයි

රාජපක්ෂ මහත්මයා තේරුම් ගත යුතුව තිබෙනවා, මේ මොහොතේ අමන්දානන්දයට පත් වුණාට මේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දික් කරලා තිබෙන කඩුව අවසානයේදී ඔබට එසවෙන්නේ නැති එක ගැන තිබෙන සහතිකය මොකක්ද? මේ රටේ පුරවැසියන්ට එසවෙන්නේ නැහැයි කියන සහතිකය මොකක්ද? ඒ නිසා ව්‍යවස්ථා විරෝධීව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත් ව්‍යවස්ථාවට පටහැණිව ආණ්ඩුව ගොඩනැගීමත් යන මේ කුමන්ත්‍රණයේ හරයාත්මක කරුණු දෙක මේ රටේ ජනතාව ප්‍රතික්ෂේප කළ යුතුයි. පාර්ලිමේන්තුවෙන් ප්‍රතික්ෂේප කළ යුතුයි. අධිකරණ පද්ධතියෙන් ප්‍රතික්ෂේප කළ යුතුයි. නැවත ආදර්ශයන් බවට පත්වීමට ඉඩකඩ ලබා නොදිය යුතුයි.

මේක අපේ රටේ දැවැන්ත ලේ වැගිරීමකට අවශ්‍ය වටපිටාවක් නිර්මාණය කරනවා. මෙවැනි ආණ්ඩු පැහැර ගැනීමක් සිදු වුණොත් - අද එක්සත් ජාතික පක්ෂයට ඒකට එරෙහිව ශක්තිමත් ප්‍රතිවිරෝධයක් දක්වන්න බැහැ. ඔවුන් ජනතාවගෙන් ඈත් වෙලා හිටපු නිසා ජනතාවත් එක්ක හිටපු ආණ්ඩුවක් නම් අද පාර්ලිමේන්තුවේ නොවෙයි මේ කට්ටිය ඉන්න ඕනෑ. මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ ගේ වටේ. ඒකයි ඇත්ත. මතක තබා ගන්න. (බාධා කිරීම්) යනවා නම් හොඳයි. හැබැයි පමායි. ඒ නිසා අපි කියන්නේ මේ ජනතාවගේ ආණ්ඩු මෙවැනි කුමන්ත්‍රණකාරී ලෙස වට්ටනවා නම් ලොකයේ ඇතිවෙන්නේ ලේ වැගිරීම්. ඒ නිසා මේ ආදර්ශය අපේ රටේ නීතිය බවට පත් වෙන්න ඉඩකඩ ලබා නොදිය යුතුයි. මේ ආදර්ශය අපේ රටේ ව්‍යවස්ථාවේ වලංගුභාවයට පත්වීමට ඉඩකඩ ලබා නොදිය යුතුයි. ඒ වෙනුවෙන් අපට ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම අපි ගන්නවා. මේ පාර්ලිමේන්තුවට දැන් සුජාතභාවයක් නැහැ. 2015 අගෝස්තු මාසයේ 16වැනිදා මැතිවරණයෙන් තෝරා ගන්නා ලද පාර්ලිමේන්තුවේ සංයුතිය අද නැහැ. ඒ ජනවරමේ පිළිබිඹුව අද මේ පාර්ලිමේන්තුවේ නැහැ.

දැන් මේ පාර්ලිමේන්තුව විකෘතියක්. එහෙට මෙහෙට පැනපු

විකෘතියක්. එමනිසා මේ පාර්ලිමේන්තුවේ කවුරු 113 හදාගත්තත් ඉස්සරහට ආණ්ඩු කරන්න යුක්ති සහගත අයිතියක් නැහැ. ඒකත් තේරුම් ගන්නට ඕනෑ. එහෙන් සල්ලිවලට අරගෙන, මෙහෙන් සල්ලිවලට අරගෙන, මෙහෙන් පනිනවාට සල්ලි දීලා පනින එක වළක්වාගෙන, එහෙන් පනිනවාට සල්ලි දීලා වටලාගෙන, මුදල්වලින් 113 හදාගත්ත - 2015 අගෝස්තු මාසයේ ජනවරම පිළිබිඹු නොවන පාර්ලිමේන්තුවක්. ඒ පාර්ලිමේන්තුව කවුරු ආණ්ඩුවක් හදාගත්තත් ආණ්ඩු කරන්න අයිතියක් නැහැ. ඒකත් තේරුම් ගන්න ඕනෑ. 113 එහෙන් මෙහෙන් අටවා ගත්තා. දැන් තමයි අපි ආණ්ඩු කරන්නේ කියා කියන්න අයිතියක් නැහැ.

එමනිසා කුමන්ත්‍රණය පරාජයට පත් කිරීමෙන් පසුව අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයකට යා යුතුව තිබෙනවා. ජනතාව හමුවට ගිහිල්ලා නව පාර්ලිමේන්තුවක් පත් කර ගනිමු. ඒකෙන් අපට ලැබෙන පංගුව කුමක්ද ඒ පංගුවේ ප්‍රමාණය කුමක්ද කියන එක අපට වැදගත් නැහැ. වැදගත් දෙය ජනතාවගේ ජනවරම විකෘති වෙච්ච පාර්ලිමේන්තුවකට ආණ්ඩු කරන්නට අයිතියක් නැහැ. ඒ පැත්තෙන් ආණ්ඩු කරන්න ගත්තත් මේ පැත්තෙන් ආණ්ඩු කරන්න ගත්තත් අයිතියක් නැහැ. ආණ්ඩු කරන්න නම් තිබෙන එකම දෙය අලුත් ජනවරමක් ජනතාව ළඟට ගිහින් ගන්න ඕනෑ. එමනිසා මේ කුමන්ත්‍රණයෙන් පසුව ජනතා විමුක්ති පෙරමුණේ අපි යෝජනාවක් ගෙන එන්නට නියමිතව තිබෙනවා. මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ යෝජනාව. විකෘති පාර්ලිමේන්තුවක් ඉස්සරහට ගෙන යනවා වෙනුවට නැවත ජනතාව ළඟට ගිහින් අපි ජනවරමක් පතමු; නව පාර්ලිමේන්තුවක් හදා ගනිමු. නව ආණ්ඩුවකට අවශ්‍ය දොර විවෘත කරමු. පළමුකොටම මේ කුමන්ත්‍රණය පරාජයට පත් කරමු. ඒ වෙනුවෙන් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි අපේ තීන්දු තීරණ ගන්නා බව ප්‍රකාශයට පත් කරමින් මම නතර වෙනවා. බොහෝම ස්තුතියි.



"දෙදෙනෙකුගේ තක්කඩි වුවමනාවට ලෝකය ඉදිරියේ අපේ රට මේ තරම් හෑල්ලුවට භාජනය විය යුතුද? මේ රටේ ජීවත් වෙන්නේ රාජපක්ෂයි මෛත්‍රීපාලයි විතරක් නම් අපි අහක බලාගෙන ඉන්නම්. හැබැයි, මේ රටේ අපිත් ජීවත් වෙනවා. අපේ උපන්, නූපන් දරු පරම්පරාවක් මේ රටේ ජීවත් වෙනවා. එමනිසා ලෝකය හමුවේ අපේ රට අභිමානවත් රාජ්‍යයක් කියන කොඩිය ඔසවා තැබීමේ වගකීමක් අපට තිබෙනවා. තමන්ගේ පෞද්ගලික වුවමනාව මත මෛත්‍රීපාලටයි, රාජපක්ෂටයි ඒ කොඩිය උඩ ජරා කරන්න පුළුවන්කම ලැබුණාට, මේ රටේ ජනතාව ලෝකය ඉදිරියේ අපට අභිමානවත් ජාතියක් ලෙස ඇතිවී තිබෙන ප්‍රතිරූපය බිඳ වට්ටන්න ඉඩකඩ ලබානොදෙන බවට අපි මේ රටේ ජනතාවට සහතික කරනවා."


**නියමුවා ප්‍රකාශන**

දුරකථන:- +94112785612
ෆැක්ස්:- +94112786050
ඊ-මේල්:- niyamuwa@jvpsrilanka.com
වෙබ්:- www.jvpsrilanka.com